**264 වන කාණ්ඩය - 7 වන කලාපය**
தொகுதி 264 - இல. 7
**Volume 264 - No. 7**

**2018 නොවැම්බර් 29වන බ්‍රහස්පතින්දා**
2018 நவம்பர் 29, வியாழக்கிழமை
**Thursday, 29th November, 2018**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන**

2018 නොවැම්බර් 14,15 සහ 16 දිනයන්හි පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ඇති වූ සිද්ධි සම්බන්ධ විමර්ශන

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස පොලීසිය කැඳවීම

**ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව**

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

2018 நவம்பர் 14, 15 மற்றும் 16ஆந் திகதிகளில் பாராளுமன்றச் சபாமண்டபத்தில் இடம்பெற்ற சம்பவங்கள் பற்றிய விசாரணைகள்

பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதி செய்வதற்குப் பொலிஸாரை அழைத்தமை

**குடியரசின் நிதியிலிருந்து எந்தவொரு செலவினத்தையும் மேற்கொள்வதற்கான அங்கீகாரத்தை வழங்குவதற்கு பிரதம அமைச்சரின் செயலாளருக்கு அதிகாரமின்மை**

---

# PRINCIPAL CONTENTS

**ANNOUNCEMENTS:**

Investigations into Incidents Taken Place in the House on 14th, 15th and 16th of November, 2018

Summoning of Police to Ensure Security of Members of Parliament

**SECRETARY TO THE PRIME MINISTER HAS NO AUTHORITY TO APPROVE ANY EXPENDITURE DRAWN FROM THE FUND OF THE REPUBLIC**

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2018 නොවැම්බර් 29වන බ්‍රහස්පතින්දා***
*2018 நவம்பர் 29, வியாழக்கிழமை*
*Thursday, 29th November, 2018*

**පූ.භා.10.30ට පාර්ලිමේන්තුව රැස්විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

I

### 2018 නොවැම්බර් 14, 15 සහ 16 දිනයන්හි පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ඇති වූ සිද්ධීන් සම්බන්ධ විමර්ශන
2018 நவம்பர் 14, 15 மற்றும் 16ஆந் திகதிகளில் பாராளுமன்றச் சபாமண்டபத்தில் இடம்பெற்ற சம்பவங்கள் பற்றிய விசாரணைகள்
INVESTIGATIONS INTO INCIDENTS TAKEN PLACE IN THE HOUSE ON 14TH, 15TH AND 16TH OF NOVEMBER, 2018

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, 2018 නොවැම්බර් මස 14 වන බදාදා, 15 වන බ්‍රහස්පතින්දා සහ 16 වන සිකුරාදා දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනු ලැබූ අවස්ථාවලදී සභා ගර්භය තුළ ඇති වූ සිද්ධීන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු පොලීසිය විසින් දැනටමත් සිදු කරමින් සිටින බවත්, ඊට අමතරව එම සිද්ධීන් පිළිබඳව අභ්‍යන්තර පුළුල් විමර්ශනයක් පැවැත්වීමට හැකි වන පරිදි පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතාගේ සභාපතිත්වයෙන්, හිටපු කථානායක ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා, ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා, ගරු බිමල් රත්නායක මහතා සහ ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා යන මහත්වරුන්ගෙන් සමන්විත කමිටුවක් මා විසින් පත් කරන ලද බවත්, එම කමිටුවේ වාර්තාව හැකි ඉක්මනින් මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බවත් කාරුණිකව දැනුම් දීමට කැමැත්තෙමි.

II

### පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස පොලීසිය කැඳවීම
பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதி செய்வதற்குப் பொலிஸாரை அழைத்தமை
SUMMONING OF POLICE TO ENSURE SECURITY OF MEMBERS OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පසුගිය 2018 නොවැම්බර් මස 14 වන බදාදා, 15 වන බ්‍රහස්පතින්දා සහ 16 වන සිකුරාදා දිනයන්හි පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වුණු අවස්ථාවලදී සභා ගර්භය තුළ ඇති වූ බරපතළ නොසන්සුන්කාරී තත්ත්වයන් නිසා අකමැත්තෙන් වුවද සියලුම මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස පොලීසිය කැඳවීමට මට සිදු වූ බව දන්වනු කැමැත්තෙමි.

තවද, පාර්ලිමේන්තුවේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ හෝ පාර්ලිමේන්තු සභා ගර්භ ආලින්දයන් තුළ ආරක්ෂාව පිළිබඳ තහවුරුවක් මා හට ලබා දෙන්නේ නම්, ඉතාමත් ඉක්මනින් සභා ගර්භයේ කටයුතු සම්බන්ධයෙන් අතිරේක ලෙස පොලීසියේ සහාය ලබා ගැනීම වහාම නැවැත්වීමට මා පියවර ගන්නා බවද මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

I

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව මෙම සභාව විසින් තීරණය කරනු ලැබිය යුතුය. එම නිසා කාලය කොපමණ අවශ්‍යද කියන එක පිළිබඳව මා දැනුවත් කරන ලෙස මා මේ අවස්ථාවේදී ආරාධනා කරනවා. How long do you want to continue?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
වැඩ කටයුතු හමාර වන තෙක්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින පූර්ව භාග 9.00ට මාගේ නිල කාමරයේදී පැවැති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි, 2018 නොවැම්බර් මස 30වන සිකුරාදා පූර්ව භාග 10.30ට පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වීමට මෙම සභාව තීරණය කරනු ලැබීය. සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Then, this morning, I had a delegation led by the Hon. Dinesh Gunawardena who raised an issue about this matter, the Motion being *sub judice*. So, I have already explained my position on the matter, that especially the matter before the House today is not with regard to any Minister, State Minister or Deputy Minister, but with regard to the Secretary to the Prime Minister.

This House has already adopted Motions of No-confidence against the Government, and the adoption of such Resolution or Motion of No-confidence cannot be challenged or disputed in any other forum. The Motion before the House today is a matter which arises consequent to the adoption of the No-confidence Motion. What is sought to be debated today is not the matter under consideration by the Court of Appeal. As such, there is no impediment to this Motion being debated in the House.

In any event, the proceedings in the Court of Appeal are not in the nature of a trial before an original court and I am of the view that no real and substantial danger or prejudice would be caused to the outcome of those proceedings by this House debating this Motion.

In any case, there is no case pending relating to payment of expenses in the Prime Minister's Office. Therefore, I am also convinced, having consulted expert constitutional lawyers in the country, that this matter does not fall within the purview of Article 152 of the Constitution. Therefore, as such, I permit this Motion to be debated in the House today.

අද දින පූර්ව භාග 9.00ට මාගේ නිල කාමරයේදී පැවති පක්ෂ නායක රැස්වීමේදී එකඟ වූ පරිදි 2018 නොවැම්බර් මස 21 වන බදාදා නිකුත් කරන ලද පත්‍රිකාවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ (2) දරන න්‍යාය පුස්තක පරිපූරකයේ පළ කරන ලද පා.2/'18 දරන නියමයක් නොමැති යෝජනාව 2018 නොවැම්බර් මස 30 වෙනි සිකුරාදා සභාවේදී ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි එදින න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 01. ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව සම්බන්ධයෙන් වූ යෝජනාව ඉදිරිපත් කිරීම.

## ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව
## குடியரசின் நிதியிலிருந்து எந்தவொரு செலவினத்தையும் மேற்கொள்வதற்கான அங்கீகாரத்தை வழங்குவதற்கு பிரதம அமைச்சரின் செயலாளருக்கு அதிகாரமின்மை
## SECRETARY TO THE PRIME MINISTER HAS NO AUTHORITY TO APPROVE ANY EXPENDITURE DRAWN FROM THE FUND OF THE REPUBLIC

[පූ.භා.10.35]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවසර ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ඔබතුමාට අපි ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම තුළින් ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය විතරක් නොව රටටත්, ජාත්‍යන්තර ලෝකයටත් ඔබතුමා මේ කරලා තිබෙන දේ අපි සම්පූර්ණයෙන්ම අගය කරනවා. මේ කථා කරන මොහොතේ අපේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායමේ අය නැවත මෙතැන යම් විධියක වර්ජනයක් කරනවා. යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර, කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා නොවැම්බර් මාසයේ 10 වෙනිදා කියපු දෙයක් පිළිබඳ පුවත් වාර්තාවක් මා උපුටා ගන්නවා - "UPFA doesn't have majority, admits Keheliya".

ඒ වාගේම, දවස් හතරකට ඉස්සෙල්ලා එස්.බී. දිසානායක "දිවයින" පත්තරයට මෙසේ කියනවා:

"113 තව දවස් හතරකින්..."

අදට දවස් පහක් වර්ජනය කිරීමෙන් පේනවා, බහුතරය කොතැනද තිබෙන්නේ කියලා ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු නවීන් දිසානායක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා-

2018 නොවැම්බර් 14 වැනි දින සම්මත කර ගන්නා ලද ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාවේ 2 වැනි ඡේදයට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති බවට කථානායකවරයා

විසින් 2018 නොවැම්බර් 15 වැනි දින කරන ලද නිල ප්‍රකාශය මෙම සභාව 2018 නොවැම්බර් 16 වැනි දින පිළිගත් හෙයින් ද, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාවේ අරමුණු කොට ඇති පරිදි 2018 ඔක්තෝබර් 26 වැනි දින සිට ගරු මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බවට මෙම සභාව තවදුරටත් යෝජනා සම්මත කරගත් හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන් බලය පැවරී ඇති පරිදි රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු හෙයින් ද;

ඊට අනුකූලව, 2018 නොවැම්බර් 15 වැනි දින සිට ජනරජයේ අරමුදල් වෙතින් කිසිදු වියදමක් අනුමත කිරීමට අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බවටත්, මෙම යෝජනා සම්මතය උල්ලංඝනය කරමින් කවර හෝ ක්‍රියාමාර්ගයක් ගන්නා කවර හෝ තැනැත්තෙකුට එරෙහිව නීතිමය පියවර ගනු ලබනු ඇති බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවේ සඳහන් වෙන්නේ මෙසේයි:

"රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේ ය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියක හෝ පවත්නා යම් නීතියක හෝ අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරයක් විසින් හෝ කිසිම බද්දක්, වරිපනමක් හෝ වෙනත් යම්කිසි බදු විශේෂයක් නියම කිරීමට බලය නොමැත්තේ ය."

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ අවස්ථාව උපයෝගි කරගෙන, පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන අපි මේ පාර්ලිමේන්තුවේ අපට දී තිබෙන වරප්‍රසාදය උපුටා ගන්නවා. මේ අවස්ථාවේදී අපට පෙනෙනවා, අවජාතක, ව්‍යාංගයෙන් ආණ්ඩුවක් වශයෙන් කටයුතු කරන අය වියදම් නොතකා, අද මේ කියන මොහොත වන විට -මේ දවස් 21 තුළ,-හෙලිකොප්ටර්වලට රුපියල් ලක්ෂ 840ක් වියදම් කර තිබෙන බව. මෙන්න මේවා තමයි අපි මේ අවස්ථාවේදී නවත්වන්න හදන්නේ. ඒ සඳහා සම්පූර්ණ බලය අපට තිබෙනවා. වහාම මේවා අත් හිටුවා කටයුතු කරන්න ඕනෑ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සියලුදෙනාම වග කියන්න ඕනෑ. ආණ්ඩුවක් පත් වෙනවා, අපේ මුදල් ඇමති මංගල සමරවීර 2018 වර්ෂයට අය වැයක් ඉදිරිපත් කරනවා, ඒක සම්මත වෙනවා, ඊට පසුව නීත්‍යානුකූල ආණ්ඩුව ගෙදර යවනවා. බහුතරයක් නැති සුළුතරයක් තිබෙන ආණ්ඩුවක්, අවජාතක ආණ්ඩුවක්, ඒ සම්මත කළ වූ මුදල පාවිච්චි කරන්න හදනවා. ඒ නිසා තමයි අප මෙවැනි අවස්ථාවක, මේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එකතු වෙලා මෙය නවත්වන්න හදන්නේ.

ඒ විතරක් නොවෙයි ගරු කථානායකතුමනි, අප රජයේ සේවකයන්ට කියන්නේ නීතිය පිළිපදින්න කියායි. ඒ, බහුතරය නැති අවජාතක ආණ්ඩුවක්. ඇහුම් කන් දෙන්න අවශ්‍ය වන්නේ බහුතරයක් තිබෙන ආණ්ඩුවකටයි.

හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහත්මයා සම්බන්ධයෙනුත් මම මේ වෙලාවේ මතක් කරන්න අවශ්‍යයි. එතුමා ඉතාමත් අවංක සේවයක් කළ, කීර්තිමත්, දක්ෂ නිලධාරියෙක්. එහෙත් එතුමාට මොනවාද වුණේ? කිසිම වැරැද්දක් නොකර, දේශපාලනඥයන් කියූ දේ කරන්න ගිහිල්ලා මීට මාස ගණනාවකට පෙර, උසාවියෙන් එතුමාට ලැබුණු දඬුවම අපට පෙනුණා. නිවැරදි දේ පිළිපදින්න කියා රජයේ සේවකයන්ට කියන්න අපට අවශ්‍ය වන්නේ මෙන්න මේ කාරණය නිසායි. අප මේ අවස්ථාවේ කරන්නේ නිවැරැදි කිරීමක්. පැහැර ගත්, කිසිසේත්ම බලයක් නැති මෙවැනි ආණ්ඩුවකට අප මේ කරුණ කියනවා. මේ අවස්ථාව උපයෝගි කරගෙන පාර්ලිමේන්තුවේ මේ සම්මත කරන යෝජනාව අනුව, මේ මොහොතේ සිට සම්පූර්ණ මුදල් කපා හැරලා, අලුත් ආණ්ඩුවකින්, බහුතරයක් ඇති කරන ආණ්ඩුවකින් එය නැවත යථා තත්ත්වයට පත්කරන තාක් කල් මේ වියදම නවත්වන්න ඕනෑ කියන කාරණාව මේ පාර්ලිමේන්තුවට යෝජනා කරනවා.

මම හිතන විධියට මට මීට වැඩිය කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මට තව එක් කාරණයක් පමණයි මතක් කරන්න අවශ්‍ය වෙන්නේ. මේ සම්බන්ධයෙන් අපි උසාවියට ගිහිල්ලා තාවකාලික ජයග්‍රහණයක් ලබාගෙන තිබෙනවා. වැඩි කල් යන්න ඉස්සෙල්ලා අනිවාර්යයෙන්ම ඒක සම්මත වෙයි කියලා අපට විශ්වාසයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව තුළ කාටද බහුතරයක් තිබෙන්නේ කියන එක අපි නොවැම්බර් 14වැනි දා, 15වැනි දා, 16වැනි දා සහ 23වැනි දා පෙන්වලා තිබෙනවා. ඒ වාගේම තමයි තාවකාලිකව අප විපක්ෂයට එවා තිබෙන මේ අවස්ථාව උපයෝගි කරගෙන, ජනතාව උසි ගන්වන්නේ නැතිව, අපි ඉවසිල්ලෙන්, ශීලාචාරව කටයුතු කරමින්, වර්තමානයේ ව්‍යාජ වශයෙන් පත් කර තිබෙන ආණ්ඩුවට කියනවා, "කරුණාකර ඉල්ලා අස්වෙන්න" කියලා. මෙතැනදී අපට ප්‍රශ්න ඇති කරන්න අවශ්‍යතාවක් නැහැ. අපි ජනාධිපතිතුමාට කියන්නේ, කරුණාකර මේක දැක බලා හරියාකාරව කටයුතු කරන්න කියන එකයි. අපි ජනතාව වෙනුවෙන් කටයුතු කරමු; මේ රටේ වැටිලා තිබෙන ආර්ථිකය අපි හදාගනිමු; අපට අවශ්‍ය සමඟිතාව ඇති කරමු; තරුණ තරුණියන්ගේ රැකියා සඳහා අවශ්‍ය මාර්ගය ඇති කරමු. එම නිසා මේ යෝජනාව සම්මත කළ පසු අපි ඉවසීමෙන් හා එකමුතුව මේ රට ගැන හිතලා කථා කරන්න අවශ්‍යයි කියන එක කාරුණිකව මතක් කරනවා.

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමාටත්, මෙහි සිටින සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නවින් දිසානායක මැතිතුමා.

[පූ.භා. 10.43]

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
ගරු කථානායකතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

විශේෂයෙන්ම මාගේ උගත් මිත්‍ර රවි කරුණානායක මැතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව පැහැදිලිව ප්‍රකාශ කළා. එම වගන්තිය අනුව පාර්ලිමේන්තුවට තමයි මේ රටේ රාජ්‍ය මූල්‍ය බලය හිමිවෙලා තිබෙන්නේ.

රජයේ තිබෙන සියලුම මුදල් වැය කිරීමේ බලය ලබා දෙන්නේ පාර්ලිමේන්තුවෙන්. සමහර කට්ටිය අද අපේ යෝජනාව සම්බන්ධයෙන් වැරැදි චිත්‍රයක් මවමින්, වැරැදි අර්ථ නිරූපණයක් කරන්න හදනවා. ගරු කථානායකතුමනි, Standing Order No. 133හි මෙහෙම සඳහන් වෙනවා:

"ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ වෙනයම් අරමුදල් වලින් හෝ ගෙවිය යුතු මුදල් වියදම් කිරීමට හෝ ගෙවිය යුතු යැයි වියදම් නියම කිරීමට, නැතහොත් කිසියම් බද්දක් පැනවීමට හෝ

[ගරු නවින් දිසානායක මහතා]

පනවා එවකට වලංගුව තිබෙන බද්දක් අවලංගු කිරීමට හෝ වැඩි හෝ අඩු කිරීමට බලය පවරන යෝජනාවක්, පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතකට කරන සංශෝධනයක්

අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස,.. "

නමුත් ගරු කථානායකතුමනි, අපි මේ යෝජනාව ගෙනෙන්නේ ඒකාබද්ධ අරමුදලෙන් මුදල් වියදම් කිරීමක් ගැන නොවෙයි. අපි පැහැදිලිව ප්‍රකාශ කරනවා, අපි මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ වැය ශීර්ෂයකට - Vote එකකට - කියලා. අගමැතිතුමාගේ ලේකම්ගේ වැය ශීර්ෂයට තමයි අපි මේ යෝජනාව ගෙනෙන්නේ. ඒ නිසා ඔබතුමා සඳහන් කළ පරිදි මෙය සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූලයි. මෙය කිරීමට අපට බලයක් තිබෙනවා. ඒ වාගේම අපි පැහැදිලිව ප්‍රකාශ කරනවා; ඔබතුමාත් පැහැදිලිව සක්සුදක් සේ ඔප්පු කරලා තිබෙනවා, අද මේ ආණ්ඩුවට බහුතරයක් නැති බව. බහුතරයක් නැති ආණ්ඩුවකට රටක් ඉදිරියට ගෙන යන්න බැහැ. එම නිසා අපි ඉල්ලනවා, සදාචාර ලෙස මේ ආණ්ඩුවට ඉල්ලා අස්වෙන්න කියලා. අද දිනෙන් පසු ඒක තවත් ඔප්පු වෙයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා ගන්නා මේ ස්ථාවරය විශේෂයෙන් මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න සියලු දෙනාම අගය කරනවා. ඔබතුමා මේ ගන්නා ප්‍රයත්නයට අද නොයෙකුත් අය ඔබතුමාට මඩ ගහනවා. ඔබතුමාගේ කීර්ති නාමයට හානි වෙන පරිදි නොයෙකුත් චෝදනා එල්ල කරනවා. අපි ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

අද දිනත් අපට පැහැදිලි බහුතරයක් තිබෙන බව අපි ඔබතුමාට කියන්න කැමැතියි. නැවතත් ඔබතුමාට අපගේ ස්තුතිය ප්‍රකාශ කරමින්, මෙම යෝජනාව මා නැවතත් ස්ථිර කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, අදහස් දැක්වීමේ අවස්ථාව. ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට වේලාව ලබා දෙන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා.

[පූ.භා.10.45]

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, මෙම අවස්ථාවේ මෙම ගරු පාර්ලිමේන්තුවට මාගේ අදහස් කීපයක් ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමා අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

අද අපේ රටේ පවතින දේශපාලන අස්ථාවරය හේතුවෙන් මේ රටේ අතිමහත් බහුතර ජනතාව ඉතාම වික්ෂිප්තභාවයකට පත් වෙලා සිටින මොහොතක්, මේ. මෙය ඉබේ ඇති වුණු දෙයක් නොවෙයි. මේකට බලපෑ කරුණු-කාරණා ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳව මම ඉතා කෙටියෙන් අදහස් දැක්වීමක් පමණක් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රට මීට අවුරුදු 70කට විතර කලින් නිදහස ලබා ගත්තාට පස්සේ, ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍ය, අධිකරණයේ ස්වාධීනත්වය, රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගනිමින්, ඒ වාගේම ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ප්‍රජාතන්ත්‍රවාදයේ කුලුනු තුන විධියට සලකන එම ආයතනවලට අන්‍යෝන්‍ය වශයෙන් ඇති ස්වාධීන අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය පවත්වා ගෙන යෑමේ වගකීම මූලිකම වශයෙන් පැවරිලා තිබෙන්නේ, මෙම පාර්ලිමේන්තුව වෙතට.

නමුත්, අතීතයේ සිදු වුණු යම් යම් හේතු කාරණා නිසාත්, වර්තමානයේ දේශපාලනඥයන් වග කිව යුතු නොවන, එහෙත් එදා දේශපාලනඥයන් විසින් වග කිව යුතු යම් යම් පැහැර හැරීම්, වැරදි තීරණ, අදූරදර්ශී ක්‍රියා හේතුවෙනුත් අපේ රට අවුරුදු 30ක ඉතා දරුණු යුද්ධයකට සම්බන්ධ වෙලා මේ රටේ ජනතාව ජාති, ආගම් භේදයකින් තොරව පීඩාවට පත් වෙලා සිටි මොහොතකයි 2015දී අපේ රටේ සියලු ජනතාවට නව බලාපොරොත්තු ලබා දෙමින් ජාතික ආණ්ඩුවක් නිර්මාණය කරන්නට අපි සියලු දෙනා එකට එකතු වෙලා කටයුතු කළේ.

එදා ඒ පැවැති යුද්ධය නිසා මේ රටේ ත්‍රිවිධ හමුදාවේ රණ විරුවන්, පොලීසියේ නිලධාරින් විසිහත්දහසක් විතර ජීවිත පූජා කර තිබෙනවා. ශ්‍රී ලාංකික පුරවැසියන් හැටදහසකගේ පමණ ජීවිත බිලි ගත්ත එවැනි අවාසනාවන්ත තත්ත්වයක් නැවතත් මේ රටේ ඇති නොවීමට වග බලා ගැනීම මේ ආණ්ඩුව නිර්මාණය කිරීමේදී අපි සියලු දෙනා රටේ ජනතාවට දුන් එක් පොරොන්දුවක්. අවුරුදු 30ක යුද්ධය නිමා වීමෙන් පස්සේ 2009 වසරේ පටන් අපේ රටේ සාමකාමී පරිසරයක් පවතින කාලවකවානුව තුළ, මේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම, ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, අධිකරණයේ ස්වාධීනත්වය යනාදී බොහෝ දේවල් අපි බලාපොරොත්තු වුණාට ඒ දේවල් ඒ ආකාරයට ඉෂ්ට නොවුණු නිසාත්, ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජන එල්ල වී තිබුණු නිසාත් මේ රටේ ඉතිහාසයේ මෙතෙක් නොවූ ආකාරයේ වෙනස් ස්වරූපයේ විප්ලවයක් කිරීමට මේ රටේ ජනතාව ආශීර්වාදය ලබා දුන්නා.

ඒ අනුව තමයි එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා වන ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රධාන කොටගෙන එදා ආණ්ඩු බලය පැවති එක්සත් ජනතා සන්ධානයේ මූලික ප්‍රධාන කොටස්කරු වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් තනතුර හෙබ වූ අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා වශයෙන් පත් කරගෙන, විශේෂයෙන්ම එක්සත් ජාතික පාක්ෂිකයන් විසින් විශාල කැප කිරීමක් කරමින් එතුමා මේ රටේ ජනාධිපතිවරයා විධියට පත් කර ගනු ලැබුවේ. එතුමාගේ ජයග්‍රහණය තුළ මේ රට නව දිශානතියකට ගමන් කරාවි කියන ශුභවාදී බලාපොරොත්තු පොදි බැඳගෙන තමයි එදා රටේ ජනතාව එතුමාට ඡන්දය ලබා දුන්නේ. ඒ අනුව එක්සත් ජාතික පක්ෂයට ආසන හතළිස් ගණනක් පමණක් මේ පාර්ලිමේන්තුවේ තිබියදී වුණත්, 2/3කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් ආරම්භය ඉතාම සාර්ථක ආණ්ඩුවක් විධියට මේ රටේ ජනතාව දශක ගණනාවක් තිස්සේ ඉල්ලා සිටි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපට සම්මත කර ගන්න පුළුවන්කම ලැබුණා. ඒ සඳහා එක්සත් ජාතික පක්ෂයේ නායක ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා

නායකත්වය දුන්නා වාගේම, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, මීට පෙර සිටි බොහොම ජනාධිපතිවරුන් පොරොන්දු දුන්නු නමුත් ඉටු නොකළ පොරොන්දු ඉටු කිරීමට එකඟතාව දැක්වූ බව මේ අවස්ථාවේදී අපි සිහිපත් කරනවා.

විධායක ජනාධිපති ධුරයේ බලතලවලින් විශාල ප්‍රමාණයක්, ජනමත විචාරණයකින් තොරව ඉවත් කළ හැකි බලතල ප්‍රමාණයක් එම ධුරයෙන් ඉවත් කර අමාත්‍ය මණ්ඩලයටත්, ව්‍යවස්ථාදායක සභාවටත්, ස්වාධීන කොමිෂන් සභාවලටත් බෙදා හැරීමට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී අපට හැකියාව ලැබුණා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉතා නිවැරදි සංශෝධනයක් කියා මම කියන්නේ නැහැ. ලෝකයේ අංග සම්පූර්ණ වූ, නිවැරදි වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපට කවදාවත් දකින්න ලැබෙන්නේ නැහැ. කුමන ආකාරයේ ව්‍යවස්ථා හැදුවත් කාලීනව සිදු වන වෙනස්කම් අනුව නීතියේ වෙනස්කම් සිදු කිරීමට රජයකට සිදු වෙනවා.

2015 වර්ෂයේ අගෝස්තු 17වැනි දින අපි පාර්ලිමේන්තු මැතිවරණයකට මුහුණ දුන්නා. අපි මැතිවරණයට පෙර පටන් ජනතාවට ප්‍රකාශ කළේ එක්සත් ජාතික පක්ෂය විධියට බහුතර ආසන සංඛ්‍යාවක් අරගෙන ආණ්ඩුවක් නිර්මාණය කිරීමට හැකි වුණත්, 113කට වැඩි බහුතර මන්ත්‍රී ආසන ගණනක් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළත් අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා නායකත්වය දෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එතුමාට සහයෝගය දක්වන කණ්ඩායමත් සමඟ එකතු වෙලා මේ පාර්ලිමේන්තුව තුළ ජාතික ආණ්ඩුවක් නිර්මාණය කරනවා කියලායි.

කෙසේ නමුත්, අවාසනාවකට මෙන් සරල බහුතර මන්ත්‍රී ආසන සංඛ්‍යාවක් එම මැතිවරණයෙන් දිනා ගැනීමට නොහැකි වුණත් අපි ජනතාවට පොරොන්දු වූ පරිදි අතිගරු ජනාධිපතිතුමාත්, ඒ වාගේම, ගරු අග්‍රාමාත්‍යතුමාත් එක්ව ජාතික ආණ්ඩුවක් පිහිටුවා 48දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලයක් හදලා, මේ රටේ පැන නැඟී තිබුණු දේශපාලනික, ආර්ථික, සමාජයීය, සංස්කෘතික ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙමින් ඉතා යුහුසුළුව ඒවා යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා වසර තුනක කාලයක් තිස්සේ ඉතාම කැපවීමෙන් කටයුතු කළා.

ඒ කාලසීමාව තුළ ප්‍රශ්න ඇති නොවුණා නොවෙයි. ඒ කාලසීමාව තුළ අපට චෝදනා ඉදිරිපත් නොවුණා නොවෙයි. නමුත් ඒ සෑම කාරණයකටම මුහුණ දෙමින් හැල හැප්පීම් අස්සේ සමහර අවස්ථාවලදී පාක්ෂිකයන් දැඩි කලකිරීමට පත්වන ස්වභාවයක් ඇති වෙද්දීත් අපි උපරිම වශයෙන් ජනතාවගේ ඒ අරමුණු, අභිලාෂ ඉෂ්ට කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරනු ලැබුවා. නමුත් අවසනාවකට මෙන් කාලයාගේ ඇවෑමෙන් අපේ ආණ්ඩුවට නායකත්වය ලබා දුන්න, රටේ නායකයා විධියට කටයුතු කරන, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා විධියට කටයුතු කරන අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ පාර්ශ්වයත් ඒ වාගේම, ගරු අග්‍රාමාත්‍යතුමාගේ පාර්ශ්වයත් එකිනෙකාට එරෙහිව, අපේ රටේ ඊට පෙර තිබුණු පැරණි අවලාද දේශපාලනයට ක්‍රමානුකූලව ගමන් කළ බව අපි දැක්කා.

ඒ අවස්ථාවලදී අපි කොතෙකුත් උත්සාහ කළේ, ජනතාව බලය ලබා දුන් වසර 5ක සම්පූර්ණ කාලය තුළ ජාතික ආණ්ඩුවක් විධියට ජනතාව අතර දේශපාලන විරසකභාවය, වෛරී, අවලාද දේශපාලනයෙන් ඉවත් වෙලා අලුත් ආදර්ශවත් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවක් ස්ථාපිත කර ගෙන යන්නයි. නමුත්, ඒ කණ්ඩායම් දෙකට නායකත්වය ලබා දුන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් තම තමන්ගේ කණ්ඩායම් දෙක සංයමයකින් යුතුව හසුරුවා ගැනීමේ කටයුත්ත කිරීමටත් නොහැකි වුණා. එම කාරණය සම්බන්ධයෙන් ඒ දෙපොළම අසමත් වුණාය කියන කාරණය මතක් කළ යුතුව තිබෙනවා. ඒ අතීත වැරැදිවලින් පාඩම් ඉගෙන ගනිමින් සිටින අවස්ථාවක දී තමයි අප අතර පැවති අන්‍යෝන්‍ය විශ්වාසය ක්‍රමානුකූලව දෙපාර්ශ්වයෙන්ම ගිලිහෙමින් පැවතුණේ. එවැනි අවස්ථාවක හිටි හැටියේම 2018 ඔක්තෝබර් මාසයේ 26 වන දින පූර්ව දැනුම් දීමකින් තොරව එවකට අග්‍රාමාත්‍ය ධුරය දරමින් සිටි ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉවත් කර, හිටපු අතිගරු ජනාධිපතිතුමා - මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරය දරපු ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා- අග්‍රාමාත්‍ය ධුරයේ දිවුරුම් දීමත්, නව අමාත්‍ය මණ්ඩයක් දිවුරුම් දීමත් සිදු වුණා. එම ක්‍රියාදාමයෙන් අනතුරුව පාර්ලිමේන්තුව වාර අවසන් කර කල් තැබීමත්, ඒ වාගේම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නියෝගයක් ලබා දී එය ගැසට් පත්‍රයේ පළ කිරීමත් සිදු වුණා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නියෝගයට එරෙහි කාරණය මේ වන විට අධිකරණයේ විභාගයට ලක් වෙමින් පවතින කාරණයක්.

කරුණු එසේ තිබියදී, නොවැම්බර් මාසයේ 14, 15 හා 16 යන දිනවල පාර්ලිමේන්තු සභා වාර පැවතියදී මේ සභා ගර්භය තුළ ගරු මන්ත්‍රීතුමන්ලා දැඩි වෛරකාරී, කලහකාරී ස්වභාවයෙන් හැසිරෙන අයුරු අපි දැක්කා. ඒ නිසා මේ රටේ ජනතාව මහජන නියෝජිතයන් පිළිබඳව, සමස්ත පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳවම දැඩි කලකිරීමකින් සහ පිළිකුල් ස්වභාවයකින් කථා කරන තත්ත්වයට අද රට පත් වෙලා තිබෙනවා. මේ වන විට මේ රටේ පාලනය ප්‍රායෝගික වශයෙන් අකර්මණ්‍ය තත්ත්වයට පත් වී, මේ රටේ සිදු වන්නේ කුමක්ද යන්න පිළිබඳව ජනතාව කිසිදු අවබෝධයකින් තොරව අපේක්ෂා භංගත්වයට පත් වෙච්ච තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ එකිනෙක පාර්ශ්වයන් අන් පාර්ශ්වයන්ට චෝදනා කිරීම, අපහාස කිරීම හා අවලාද කිරීම යන සිදුවීම් දිගින් දිගටම සිදු වුණත්, ඒ කිසිවකින් මේ රටේ ජනතාවට සුගතියක් සිදු වන්නේ නැති බව මෙම ගරු සභාවේ සියලුදෙනා පිළිගන්නා කාරණයක් කියා මා විශ්වාස කරනවා.

අගමැති විය යුත්තේ කවුද, අමාත්‍ය මණ්ඩලය සකස් විය යුත්තේ කුමන පුද්ගලයන්ගෙන්ද, පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුත්තේ හෝ විසුරුවා හැර ඇති ලෙස සැලකිය යුත්තේ කුමන දිනකදීද යනාදී කාරණා විධායකයේ ප්‍රධානියා සහ ව්‍යවස්ථාදායක විසින් නිශ්චය කරගත යුතු කාරණා විනා, අධිකරණය විසින් විභාගකොට තීරණය කළ යුතු කාරණා වශයෙන් මා පිළිගන්නේ නැහැ.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ රටේ ව්‍යවස්ථාදායක බලය සහ අධිකරණ බලය පැවරී තිබෙන්නේ උත්තරීතර පාර්ලිමේන්තුව වශයෙන් සලකන මෙම සභාවටයි. මේ සභාව වෙත පැවරී තිබෙන එම උත්තරීතර බලය මෙම පාර්ලිමේන්තුව විසින් සකස් කරනු ලබන; සම්පාදනය කරනු ලබන නීති ක්‍රමවේදය තුළ විසඳීම සඳහා පාර්ලිමේන්තුවට බලය පවරා දෙන්නේත් මේ පාර්ලිමේන්තුව විසින්මයි. එවැනි තත්ත්වයක් යටතේ මේ පාර්ලිමේන්තුව තුළ මතුවන කාරණා; විධායකය සහ පාර්ලිමේන්තුව - ව්‍යවස්ථාදායකය - අතර ඇතිවන මතභේද හා ගැටුම්කාරී දේවල් මේ පාර්ලිමේන්තුවේ සිටින මහජන නියෝජිතවරුන් 225දෙනාට සාකච්ඡා මාර්ගයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළින් විසඳා ගැනීමට හැකියාවක් නැහැයි කියලා රටට ඔප්පු වන අවස්ථාවක ජනතාව අපෙන් ප්‍රශ්න කළොත්, "ජනතාවගේ ප්‍රශ්න විසඳන්න මේ පාර්ලිමේන්තුවට පුළුවන්ද?" කියලා, අපි සියලුදෙනාටම නිරුත්තර වන්න සිද්ධවනවා, ඒ ප්‍රශ්නය ඉදිරියේදී. ඒක නිසා මෙවැනි ප්‍රශ්න අධිකරණයට විසඳීමට, තීන්දු තීරණ ගැනීමට ලබා දීම තුළින්

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

සිදුවන්නේ මේ පාර්ලිමේන්තුව හෑල්ලුවට ලක්වීමක් මිසක්, රටේ ප්‍රශ්න විසඳීමක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ - ව්‍යවස්ථාදායකයේ- නායකයා, විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා සමඟ සම්බන්ධීකරණය කරමින් මේ මතු වෙලා තිබෙන ව්‍යවස්ථාදායක, විධායක ගැටුම නිරාකරණය කර ගැනීම සඳහා මේ රටේ ජනාධිපතිවරයාට සහ ගරු කථානායකතුමා වන ඔබතුමාට විශාල වග කීමක් පැවරී තිබෙනවා.

අද රටේ මතු වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? විධායකය විසින් නිකුත් කරනු ලබන විධානයන් ව්‍යවස්ථාදායකය පිළිනොගන්නා තත්ත්වයට පත් වීම තුළත්, ව්‍යවස්ථාදායකය විසින් සම්මත කර ගනු ලබන යම් යම් යෝජනා විධායකය පිළිනොගන්නා තත්ත්වයට පත් වීම තුළත්, ප්‍රජාතන්ත්‍රවාදය ඒ ස්ථානයේම ඇනහිටපු තත්ත්වයක්, ව්‍යවස්ථාදායක හිරවීමක් - Constitutional deadlock -මේ රටේ සිදු වෙලා තිබෙන ආකාරය අපි දකිනවා. මෙවැනි අවස්ථාවක මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනාගේම වගකීම වන්නේ, දේශපාලන අවස්ථාවාදය පිළිබඳව කල්පනා කිරීම නොවෙයි. මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන ප්‍රශ්නවලට නිසි පරිදි, සාර්ථකව පිළිතුරු දීලා මේ රට ස්ථාවර කර ගැනීමයි ඒ සියලුදෙනාගේම වගකීම වන්නේ. මේ දේශපාලන අස්ථාවරත්වය තුළ මේ රටේ ජයග්‍රහණය ලබන දේශපාලන නායකයෙක් නැහැ; ජයග්‍රහණය ලබන දේශපාලන පක්ෂයක් නැහැ. අපි එකිනෙකාට අවලාද කර ගනිමින්, මේ දේශපාලන සංස්කෘතිය මේ රටේ තවදුරටත් දිගින් දිගටම පවත්වාගෙන යාමෙන් අනාගතය පිළිබඳව අඳුරු සේයා පතිත වෙමින් තිබෙනවාය කියන කාරණය අපි අමතක කරන්න හොඳ නැහැ. විශේෂයෙන්ම අද මේ ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුව තුළ සිදු වන දෑ පිළිබඳව අපේ රටේ තරුණ පරම්පරාව දක්වන අදහස්; ඒ උදවිය කථා කරන දේවල් අහලා බැලුවාම, මේ ක්‍රමය ප්‍රතික්ෂේප වන දිනය අත ළඟයි කියා අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විශ්වාසය නැවතත් මේ රටේ ජනතාව තුළ ඇති කිරීම පිණිස- අතීතයට ශාප කිරීමෙන් අපට ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ.- අනාගතය දෙස සුබවාදීව බලලා කටයුතු කරන්න අපට සිදු වෙනවා.

පසුගිය කාල සීමාව තුළ සිද්ධ වුණු දේවල්වල හරි වැරදි සොයමින්, පශ්චාත් මරණ පරීක්ෂණ කිරීම තුළ නොවෙයි අපට මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්න හැකියාව ලැබෙන්නේ. එම හැකියාව ලැබෙන්නේ, අපි සුබවාදී ලෙස එකිනෙකා පිළිබඳව අන්‍යොන්‍ය අවබෝධයක්, විශ්වාසයක් ඇති කර ගනිමින්, නැවතත් මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ, මේ රටේ මේ පාර්ලිමේන්තුව තුළ බහුතරයක් මෙහෙයවන්න පුළුවන් කණ්ඩායමකට -කුමන කණ්ඩායම වුණත් ඒ කණ්ඩායමට- ආණ්ඩුවක් පිහිටුවීම සඳහා අවස්ථාව ලබා දීම තුළින්ය කියන කාරණය මා මතක් කරනවා. ඒ වෙනුවෙන් මන්ත්‍රීවරයකු විධියට ඕනෑම කැප කිරීමක් කරන්න මා සූදානම් වාගේම, අනෙක් සියලුදෙනාත් සූදානම් බව මා දන්නවා.

ගරු කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී මේ අදහස් දැක්වීම සිදු කිරීමට විශේෂයෙන්ම තීරණය කළේ, මේ කාරණයේදී ප්‍රධාන වගකීම දරමින්, මේ ප්‍රශ්නය නිරාකරණය කිරීමේ කර්තව්‍යයේදී වැඩිම වගකීමක් දරමින්, එය සාර්ථකව ඉෂ්ට කරන්න පුළුවන් ඔබතුමාට පමණක්ය කියන කාරණය ඔබතුමාට අවධාරණය කරන්න, සිහිපත් කරන්න ඕනෑ නිසායි. අපි විශ්වාස කරනවා, අතීතයේ අප කාගේ අතිනුත් යම් යම් වැරදි අඩු පාඩුකම් සිද්ධ වුණත්, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් විශාල කැප කිරීමක් කරලා, විශාල විප්ලවයක් කරලා, එදා අපේ පක්ෂයත් එක්ක එකට එකතු වෙලා මේ රටේ ලක්ෂ 62ක් වූ ජනතාව එතුමාට ලබා දුන් විශ්වාසය ආරක්ෂා කර ගනිමින්, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත්, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මත් ආරක්ෂා කර ගැනීමට එතුමා කටයුතු කරාවි කියා. ඒ විශ්වාසය අපට තවදුරටත් තිබෙනවා. ඉදිරි කෙටි කාල පරිච්ඡේදය තුළ යම් සම්මුතියකට ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂ නායකයන් සමඟත්, අතිගරු ජනාධිපතිතුමා සමඟත් සාකච්ඡා කිරීම තුළින් ඔබතුමාට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්ය කියන විශ්වාසය මේ අවස්ථාවේදී පළ කරමින්, මා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ තවත් නොයෙකුත් වැඩ කටයුතු ඇති. හැබැයි ඒ සියල්ල තාවකාලිකව හෝ අත් හිටුවා ඔබතුමා මේ වෙනුවෙන් මැදිහත් වෙන්න, අතිගරු ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා, මේ ප්‍රශ්නය දිනයක් හෝ දෙකක් ඇතුළත විසඳා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමින් බහුතර ආණ්ඩුවක් ගෙන යා හැකි කණ්ඩායමකට බලය ලබා දීලා, මේ රටේ දේශපාලන ස්ථාවරය නැවත ඇති කරන්න කියායි මා ඔබතුමාගෙන් ඉල්ලන්නේ. මම ඒ ඉල්ලීම අතිගරු ජනාධිපතිතුමාගෙන් කර තිබෙනවා. එතුමාගේ පැත්තෙන් ඒ පිළිබඳව දැඩි කැමැත්තක් තිබෙන බවක් පෙනෙන්න තිබෙනවා. නමුත් ඒ පිළිබඳව නිල වශයෙන් කටයුතු කිරීමේ ශක්තිය, නීතිමය බලය ව්‍යවස්ථානුකූලව ඔබතුමාට ඇති නිසා ඒ සඳහා මැදිහත් වන ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිය ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා සඳහන් කළ කරුණු ගැන මම පූර්ණ අවධානය යොමු කරනවා. ඒ වාගේම මේ ගරු සභාවට සඳහන් කරන්න ඕනෑ, අතිගරු ජනාධිපතිතුමාත් මාත් අතර කථා කිරීමේ අපහසුතාවක් නැති බව. අපට සාකච්ඡා කරන්න පුළුවන්. අන්‍යෝන්‍ය විශ්වාසය තිබෙනවා. මම මේ කාර්යයේදී ඉදිරිපත් වුණේ විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නයි. ඒ වාගේම අපගේ යුතුකමක් තිබෙනවා ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට, විශේෂයෙන්ම නූපන් පරපුරට ආරක්ෂා කර දීමට. අද මේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්න විසඳීමට, ඔබතුමා යෝජනා කළ පරිදි මා හැකි සෑම උත්සාහයක්ම දරනවා. අවංක උත්සාහයක් දරනවා, ඉතාම ඉක්මනින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා මාර්ගයෙන් විසඳා මහජන මතය අනුව, ඒ වාගේම පාර්ලිමේන්තුවේ බහුතර මතය අනුව රට යථා ස්ථාවරභාවයට පත් කිරීමට. බොහොම ස්තුතියි. ඊළඟට, ගරු,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Rauff Hakeem will speak.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ඉල්ලීමක් කළා, first. Hon. Hakeem may speak after him.

[පූ.භා. 11.07]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව පිළිබඳව කරුණු කිහිපයක් දක්වන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, මේ යෝජනාවට පෙර ඔබතුමා ඉදිරිපත් කරපු අදහස් සහ ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කරපු අදහස් පිළිබඳවත් යමක් කිවයුතුයි කියා මා කල්පනා කරනවා. ගරු කථානායකතුමනි, අපි කවුරුත් ඇති වෙන අර්බුදයක් සාමකාමීව විසඳා ගැනීම වෙනුවෙන්, සාකච්ඡාමය ලෙස විසඳා ගැනීම වෙනුවෙන් සුබවාදී අපේක්ෂාවන් සහ බලාපොරොත්තු තබා තිබෙනවා. ඇති වෙන අර්බුදයක් තව තව දිග්ගැස්සෙන අර්බුද බවට පත් කර ගනිමින් විසඳා ගැනීමේ මාවත කවුරුත් කල්පනා කරන්නේ නැහැ. ඒ නිසා අපි ඔක්කෝම සාමකාමීව විසඳා ගැනීම සඳහා ප්‍රයත්න දැරිය යුතුයි. හැබැයි, ගරු කථානායකතුමනි, ප්‍රශ්න තේරුම්ගත යුතුව තිබෙන්නේ ඕපපාතිකව නිර්මාණය වූ ප්‍රශ්න විධියට නොවෙයි. ස්වාභාවික ව්‍යසනයකදී අපි අතර පොදු සම්මුතියක් ආ හැකිව තිබෙනවා. ස්වාභාවිකව සිද්ධ වෙන ගැටලුවකදී අපි අතර පොදු සම්මුතීන් ආ හැකිව තිබෙනවා. හැබැයි, ගරු කථානායකතුමනි, හිතාමතා කුමන්ත්‍රණකාරී ලෙස කරන ලද අර්බුදයන්ට පොදු සම්මුතීන් හොයා ගන්නේ කොතැනද? මම ඒක මේ ගරු සභාවෙන් දැන ගන්න කැමැතියි. මේ ස්වාභාවික ව්‍යසනයක් හෝ ඕපපාතිකව නිර්මාණය කරන ලද්දක් නොවෙයි. මෙය සැලසුම්කොට දියත් කරන ලද කුමන්ත්‍රණයක අර්බුදයක්. එවැනි කුමන්ත්‍රණයක අර්බුදයක් සාකච්ඡා මේස තුළ, සාමකාමී මේස තුළ, සහජීවනයේ මේස තුළ විසඳාගත හැකි වේවි කියන විශ්වාසයක් නම් ජනතා විමුක්ති පෙරමුණේ අපට නොමැති බව මේ ගරු සභාවට කියන්න කැමැතියි, ගරු කථානායකතුමනි. එය විසඳා ගැනීමේ රාමුව කුමක්ද? ගරු කථානායකතුමනි, අපි කැමැති වුණත්, අකැමැති වුණත් අපේ රටේ හැම කෙනාම යටත් වෙන නීතියක් තිබෙනවා. ඒ තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගොඩ නඟන දවසේ සිටම එහි තිබෙන අනිටු ප්‍රතිවිපාක පිළිබඳව මේ රටත් එක්ක පුළුල් දේශපාලන සංවාදයක් කරපු ව්‍යාපාරයක්; මෙහි තිබෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී ගති ලක්ෂණ සමාජයට කවර ආකාරයේ විනාශයක් කළ හැකිද කියලා විශාල සංවාදයක් කරපු දේශපාලන ව්‍යාපාරයක්. ඒ වාගේම මේ ව්‍යවස්ථාවට ගෙනෙන ලද ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණ දෙකක් වන දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් -විශේෂයෙන්ම දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේදී- සුවිශේෂී පුරෝගාමී කාර්ය භාරයක් අප විසින් ඉටු කරනු ලැබුවා.

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදීත් යම් සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කළා යැයි කියන විශ්වාසයක් අපට තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අපි පිළිගන්නා කරුණු මෙන්ම අපි නොපිළිගන්නා කරුණු තිබෙනවා. අපි එකඟ වෙන වාගේම එකඟ නොවෙන කරුණු තිබෙනවා. හැබැයි, ප්‍රශ්නය අපි එකඟ වීම හා එකඟ නොවීම නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අද අපි කවුරුත් යටත්. ජනාධිපතිවරයාගේ සිට සාමාන්‍ය සිවිල් පුරවැසියා දක්වා සෑම දෙනාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්කම තිබෙනවා, යටත් වී තිබෙනවා. එම නිසා මේ ප්‍රශ්න විසඳා ගැනීමේ මාර්ගෝපදේශකයා බවට පත් වෙන්නේ මේ එකතු වී තිබෙන සාකච්ඡා පමණක් නොවෙයි. මේ මාර්ගෝපදේශකත්වය, මඟ පෙන්වීම කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. එම නිසා ජනාධිපතිවරයා කටයුතු කළ යුතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව. දැන් පැන නැඟී ඇති ප්‍රශ්නය එතැනයි තිබෙන්නේ. ජනාධිපතිවරයාගේ සිට සෑම පුරවැසියකුටම තමන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සීමා මායිම් හඳුන්වා දී තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබියදී ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කිසිසේත්ම සැලකිල්ලට භාජනය නොකොට, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව කිසිසේත්ම අවධානයට ලක් නොකොට තමන්ගේ හිතුවක්කාරී, තක්කඩි වුවමනාවන් වෙනුවෙන් කටයුතු කිරීම තමයි මේ අර්බුදය පතුලේ තිබෙන හරය.

ගරු කථානායකතුමනි, එම නිසා අපි කියන්නේ, ජනාධිපතිතුමා සමඟ ඔබතුමා සාකච්ඡා කළාට අපට කමක් නැහැ, තව අය සාකච්ඡා කළත් කමක් නැහැ, සාකච්ඡාවට අතරමැදියන් සම්බන්ධ වුණත් අපට ප්‍රශ්නයක් නැහැ; හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ අපි නම් කිසිවක් ඔහු සමඟ සාකච්ඡා කරන්නේ නැහැ. ඒක මතක තබා ගන්න. ගරු කථානායකතුමනි, සාකච්ඡාවලදී ලැබෙන ප්‍රතිඵලයන් තිබෙනවා. අපි දන්නවා ඒක. එකිනෙකා අතර තිබෙන අනවබෝධය සාකච්ඡා හරහා විසඳා ගන්නට පුළුවන්. එකිනෙකා අතර තිබෙන ප්‍රශ්නයක දුර, ඒ ප්‍රශ්නයේ ගැඹුර සාකච්ඡා හරහා විසඳා ගන්නට පුළුවන්. එම නිසා සාකච්ඡා මේසයෙන් විසඳා ගත හැකි ප්‍රශ්න තිබෙන බව අපි පිළිගන්නවා. හැබැයි, මේ ප්‍රශ්නය අනවබෝධයේ ප්‍රශ්නයක්වත්, එකිනෙකා අතර සීමා මායිම් නොතිබීම පිළිබඳ ප්‍රශ්නයක්වත් නොවෙයි, කුමන්ත්‍රණයක්. කුමන්ත්‍රණය සාකච්ඡා මේසය තුළ විසඳා ගන්නට පුළුවන් නම් හරිම සතුටු වෙනවා. ඒක අලුත් අත් දැකීමක්.

ගරු කථානායකතුමනි, අපි ජනාධිපතිවරයාගේ සාකච්ඡා ගණනාවකට සහභාගී වී තිබෙනවා. ඔහු ඒ සාකච්ඡාවලදී දෙන එකඟතාවන් සහ ඒ සාකච්ඡාවලදී අපි හමුවේ දෙන ලද ප්‍රකාශයන්, සහතික වීම් කිසිවක් නිසි පරිදි ඉටු නොකරන ලද නායකයෙක්. ඒක ඇත්ත. මම දන්නේ නැහැ අනෙක් අය ඒක විශ්වාස කරයිද කියා. ඔවුන්ට ඒ සාකච්ඡා කිරීමේ නිදහස, කථා කිරීමේ නිදහස සියල්ල තිබුණත් අපි ඒ කථා කිරීම පිළිබඳව නම් අබ මල් රේණුවකවත් විශ්වාස තබන්නේ නැහැ. අපේ මැදිහත් වීම සහ අපේ පෙලඹවීම තිබෙන්නේ ජනාධිපතිවරයා බැඳී තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එතුමා යටත් කිරීමයි. ඒකයි අපේ අරගළය. එහෙම නැතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එළියට කැඳවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එළියේ කෙරෙන සාකච්ඡා නොවෙයි. අපේ අරගළයේ මුඛ්‍ය පරමාර්ථය බවට පත් වී තිබෙන්නේ ජනාධිපතිවරයා ආරක්ෂා කිරීමට බැඳී සිටින, වග කීමට බැඳී තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මේ ජනාධිපතිවරයා යටත් කළ යුතුයි කියන එකයි. ඒක තමයි ඔහුගේ දිවුරුම. ඒක තමයි ඔහුට ජන වරමේ තිබෙන බලය. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ ඔහුට පවරා දී තිබෙන සීමා මායිම. ඒ නිසා මේ අරගළයන් කවරක්වත් නොව වර්තමාන ජනාධිපතිවරයා අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කිරීමය. මේක තමයි අපේ අපේක්ෂාව. ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කිරීම වෙනුවෙන් ගරු කථානායකතුමනි, ව්‍යවස්ථාදායකය ලෙස අපට පැවරී තිබෙන කාර්ය භාරයන් විශාල ප්‍රමාණයක් අප විසින් ඉටු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, 14 වැනිදා පාර්ලිමේන්තුවේදී නිසි පරිදි විශ්වාස භංග යෝජනාවක් සම්මත වී තිබෙනවා. අපේ රටේ ආණ්ඩුවක් ඡන්දවලදී වට්ටන්න පුළුවන්. හැබැයි, ඡන්දයක සිට තවත් ඡන්දයක් දක්වා ආණ්ඩුවක් වැට්ටවීම සඳහා පාර්ලිමේන්තුවට අවස්ථා තුනක් තිබෙනවා. ඡන්දයක සිට තවත් ඡන්දයක් දක්වා ගොඩනඟන ලද පාර්ලිමේන්තුවක් ඇතුළේ ආණ්ඩුවක් වැට්ටවිය හැකි අවස්ථා තුනක් තිබෙනවා. පළමුවැන්න, ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පරාජයට පත් කිරීම හරහා ආණ්ඩුව වැට්ටවිය හැකියි. දෙවැන්න, අය වැය ලේඛනය පරාජයට පත් කිරීම හරහා ආණ්ඩුව වැට්ටවිය හැකියි. තුන්වැන්න, ආණ්ඩුවට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් සම්මත කිරීම හරහා ආණ්ඩුව වැට්ටවිය හැකියි. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පරාජයට පත්කළ හැකිව තිබුණා. නමුත් ඔහු ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළේ නැහැ. අය වැය ලේඛනය පරාජයට පත් කළ හැකිව තිබුණා. හැබැයි, අය වැය ලේඛනය දක්වා පාර්ලිමේන්තුව ගෙන යන්න ඔහු ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, නිශ්චිත වශයෙන් කුමන්ත්‍රණකාරී ලෙස අටවා ගන්නා ලද ආණ්ඩුව පරාජයට පත් කිරීමේ නිශ්චිත අවස්ථාව

[ගරු අනුර දිසානායක මහතා]

තිබුණේ විශ්වාස භංග යෝජනාවක් හරහා පරාජයට පත් කිරීම. එය තමයි පසුගිය 14 වැනිදා සිදු වුණේ. 14 වැනිදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුරූපී වන පරිදි, පාර්ලිමේන්තු රීතීන්වලට අනුරූපී වන පරිදි ඉතාමත් වැදගත් ලෙස විශ්වාස භංග යෝජනාවක් සම්මතකොට, තිබුණු ආණ්ඩුව විසුරුවා හැරීමට භාජනකොට තිබෙනවා. එය පාර්ලිමේන්තුවේ කටයුත්තක්. පාර්ලිමේන්තුවේ ප්‍රධානියා හැටියට ඔබතුමා, පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනාව ඡන්ද විමසීමට ලක්කොට තිබෙනවා. 15 වැනිදා ආණ්ඩුවක් නොමැති බව පාර්ලිමේන්තුවට ප්‍රකාශයට පත්කොට තිබෙනවා. කථානායකවරයා හැටියට ඔබතුමාට පැවරී තිබෙන බල සීමාවන් ඇතුළේ තමන්ගේ නියෝග ලබා දෙනවා වාගේම, ජනාධිපතිවරයා තේරුම් ගත යුතුව තිබෙනවා, තමන්ට පැවරී තිබෙන බල සීමාව ඇතුළේ තමයි තමන් කටයුතු කළ යුතු වන්නේ කියා. විශ්වාස භංග යෝජනාවක දිග පළල, විශ්වාස භංග යෝජනාවක අඩංගුව, විශ්වාස භංග යෝජනාව සම්මත වීමේ ආකාරය පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් කරන්න ජනාධිපතිවරයාට අයිතියක් නැහැ. ඒක ජනාධිපතිවරයා තේරුම් ගත යුතුයි. විශ්වාස භංගය ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරයක්. ඒක විධායකයේ කාර්ය භාරයක් නොවෙයි. ඒ නිසා විශ්වාස භංගය ගැන සාකච්ඡාව සහ සම්මතවීම පිළිබඳව තිබෙන්නේ ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරයක්. ව්‍යවස්ථාදායකයේ කාර්ය භාරය නිසි පරිදි ඉටු වූ බවට සහතික කරන්නේ ගරු කථානායකතුමා. ගරු කථානායකතුමා 15 වැනිදා පාර්ලිමේන්තුව නිශ්චිත පරිදි ව්‍යවස්ථාදායකය ඇතුළේ ආණ්ඩුව පරාජයට පත් වූ බව, කැබිනට් මණ්ඩලය විසුරුවා හැරිය බව ප්‍රකාශයට පත්කොට තිබෙනවා.

දැන් ජනාධිපතිවරයාට තිබෙන්නේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට. ජනාධිපතිවරයා  බැඳී සිටින්නේ ව්‍යවස්ථාවට. එහෙම නැතුව අපේ මුහුණ බලලා හිනා වෙන්න හෝ, අපේ කරට අත දමාගන්න  හෝ, සාකච්ඡාවකදී හෝ එකට කෑම වේලක් කමු කියන්න හෝ නොවෙයි. ඒවා අපට යාළු මිත්‍රකම්වලට කරගන්න පුළුවන්. හැබැයි, රටේ ප්‍රශ්නවලදී ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බැඳී ඉන්නවා. එම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින් කළ යුතු වන්නේ, පාර්ලිමේන්තුවේදී විශ්වාස භංග යෝජනාවක් සම්මත වූ වහාම ඔහුට පැවරී තිබෙන කාර්ය භාරය වන්නේ නව ආණ්ඩුවක් පත් කිරීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තමා  බැඳී සිටින පංගුව වන යළි ආණ්ඩුවක් පිහිටුවීමේ කටයුත්ත පසුගිය 14වැනි දා සිට, එහෙම නැත්නම් 15වැනි දා සිට මේ දක්වා ජනාධිපතිවරයා අත් හරිමින් තිබෙනවා. ඒ, යළිත් මහින්ද රාජපක්ෂ මහත්මයාම පත් කිරීම නම්, ඒත් කමක් නැහැ. අපට ප්‍රශ්නයක් නැහැ. ගරු කථානායකතුමනි, හැබැයි අද අස්ථාවරත්වයක්, එහෙම නැත්නම් ආණ්ඩුවක් නැති තත්ත්වයක් නිර්මාණය වී තිබෙන්නේ අන් කවරක් නිසාවත් නොවෙයි, විශ්වාස භංග යෝජනාවක් සම්මත වුණාට පසුව ව්‍යවස්ථානුකූලව ජනාධිපතිවරයාට පැවරී තිබෙන කාර්ය භාරය ඉටු නොකිරීම නිසායි. මේ පිළිබඳව ජනාධිපතිවරයාත් එක්ක සාකච්ඡා කරනවා නම්, කුමන කරුණුද සාකච්ඡා කරන්න තිබෙන්නේ? පාර්ලිමේන්තුව තුළ විශ්වාස භංග යෝජනාවක් සම්මත වුණාට පසු ඉදිරි ක්‍රියාමාර්ගවලට යා යුතුව තිබෙනවා. ඔහු තක්කඩි සහ හිතුවක්කාර ලෙස මේ රටත්, අපේ ජනතාවත් විශාල අස්ථාවරභාවයකට පත් කරමින්, හිතුවක්කාර ලෙස හැසිරෙමින් ඉන්නවා. ඒ නිසා තමයි ගරු කථානායකතුමනි, නැවත 16වැනි දාත් විශ්වාස භංග යෝජනාවක් සම්මත කරලා දැන්වත් ක්‍රියාත්මක වීම සඳහා ජනාධිපතිවරයාගේ ඇස් අරවන්න උත්සාහ කරමින් ඉන්නේ. අද යෝජනාවේ අරමුණත් ඒකයි ගරු කථානායකතුමනි. මේ යෝජනාවේ අරමුණ අන් කවරක්වත් නොවෙයි, ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කිරීමයි. ජනාධිපතිවරයා යටත් වන්නේ තමන්ගේ මනසේ හැදෙන සිතුවිලිවලට නොවෙයි; තමන්ගේ මනසේ ඕපපාතිකව නිර්මාණය වන අදහස්වලට නොවෙයි. ජනාධිපතිවරයාට රිසි සේ හැසිරීම සඳහා බලයක් ලබා දීලා නැහැ ගරු කථානායකතුමනි. ඔහුගේ සීමා මායිම්, සීමා රාමු මොනවාද කියන එක නිශ්චිත ලෙස සඳහන් කොට තිබෙනවා. ඒ සීමා මායිම්, සීමා රාමු තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. එම නිසා ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත් කළ යුතුයි. ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයෙක් රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟ නොවී කටයුතු කර තිබෙනවා නම්, සාමාන්‍ය පුරවැසියන්ට අපි කියන්නේ කොහොමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට යටත් වෙන්න කියලා? ගරු කථානායකතුමනි, මේ රටේ පුරවැසියන් හෙට සිවිල් නීති කැඩීමේ ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වුණොත්, ජනාධිපතිවරයාට මොකක්ද, තිබෙන අයිතිය සිවිල් නීති කඩන්න එපා කියලා කියන්න? ජනාධිපතිවරයා රටේ මූලික නීතිය කඩනවා නම්, මේ රටේ අනෙක් පුරවැසියන් නීතිය ආරක්ෂා කළ යුත්තේ කුමක් වෙනුවෙන්ද? ජනාධිපතිවරයා රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩනවා නම්, මේ රටේ රාජ්‍ය සේවකයන් නීතිය ආරක්ෂා කරන්නේ කුමක් වෙනුවෙන්ද? ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩනවා නම්, මේ රටේ පුරවැසියන් නීතියට යටත් වෙන්නේ කුමන වුවමනාව වෙනුවෙන්ද? එම නිසා ජනාධිපතිවරයා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රධාන බලධාරියා සහ ප්‍රධාන ආදර්ශකයා විය යුතු වන්නේ. හැබැයි, ප්‍රධාන බලධාරියා සහ ප්‍රධාන ආදර්ශකයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින්ම කඩමින්, උල්ලංඝනය කරමින් කටයුතු කරනවා නම්, ව්‍යවස්ථාදායකයට පැවරී තිබෙන්නේ අන් කවරක්වත් නොවෙයි ගරු කථානායකතුමනි, නැවත නැවතත් ජනාධිපතිවරයාගේ හිතුවක්කාරී, තක්කඩි ක්‍රියාමාර්ගය පෙන්වා දීමයි. ඒ සඳහා තමයි අද මෙම යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව ගෙන ඒම ඉතාම පැහැදිලිව ව්‍යවස්ථාදායකයට පැවරී තිබෙන කාර්ය භාරයක්. මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තුවට අවස්ථාව තිබෙන බව ඔබතුමා අද දැනුම් දුන්නා. ඒකට ස්තුතිවන්ත වෙනවා. ඒක එහෙම තමයි. මේ පාර්ලිමේන්තුවට තමයි රාජ්‍ය මූල්‍ය බලය පැවරී තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මම දැක්කා, විශාල සංවාදයක් යනවා, මේ යෝජනාව අමාත්‍යවරයෙකු ඉදිරිපත් කළ යුතුයි කියලා. හැබැයි, අපි කාරක සභා අවස්ථාවේදී අය වැය විවාදය පටන් ගන්නේ කොහොමද? කාරක සභා අවස්ථාවේදී විවාදය පටන් ගන්නේ, "යම් වැය ශීර්ෂයක මුදල් කපා හැරිය යුතුය" කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් යෝජනා කිරීමෙන්. ගරු කථානායකතුමනි, ඒ යෝජනාව අන්තිමට පරාද වෙන එක වෙනම දෙයක්. හැබැයි, ගරු කථානායකතුමනි, අය වැය ලේඛනයෙන් යෝජනා කරලා තිබෙන අමාත්‍යාංශයක වැය ශීර්ෂයක යම් මුදලක් කපා හැරීම පිළිබඳව යෝජනාව ගෙනෙන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. කැබිනට් ඇමතිවරයෙක් මුදල් පිළිබඳ යෝජනා ගෙනෙන්න ඕනෑ කියලා තර්කයක් අද විතරක් මොකටද, ගෙනෙන්නේ?

අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ විවාදය පටන් ගන්න කොටම, "වැය ශීර්ෂයකින් රුපියල් 10ක් කපා හැරිය යුතුය" කියන යෝජනාව සම්ප්‍රදායයක් ලෙස ඉදිරිපත් කරන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ඒක නිසා ඕනෑම මන්ත්‍රීවරයෙකුට අවස්ථාවක් තිබෙනවා, යම් වැය ශීර්ෂයක් සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න. අන්න ඒ ආදර්ශය අනුව යමින් තමයි අද අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ, අග්‍රාමාත්‍යවරයාගේ වැය ශීර්ෂය අත් හිටුවීමේ යෝජනාව. ඇයි, ඒ යෝජනාව ගෙනෙන්නේ, ගරු කථානායකතුමනි? අපේ රටේ අග්‍රාමාත්‍යවරයෙක් නැහැ. හැබැයි, අග්‍රාමාත්‍යවරයෙක් නැති වුණාට අග්‍රාමාත්‍යවරයාට ලැබී තිබෙන වරප්‍රසාද සහ අනෙකුත් හිමිකම් සියල්ල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් භුක්ති විඳිනවා. ගරු කථානායකතුමනි, ඒක යුක්ති සහගතද?

මහින්ද රාජපක්ෂ මහත්තයාටත් හිමි විය යුතු වන්නේ මේ පාර්ලිමේන්තුවේ තවත් මන්ත්‍රීවරයෙකුට හිමි වෙන වරප්‍රසාද සහ

අයිතීන් පමණයි. හිටපු ජනාධිපතිවරයා හැටියට ඔහුට යම් වරප්‍රසාද තිබෙනවා නම්, ඒවා වෙනම. හැබැයි, අග්‍රාමාත්‍යවරයෙක් ලෙස ඔහුට කිසිදු වරප්‍රසාදයක් සහ අයිතියක් හිමි නැහැ, ගරු කථානායකතුමනි. ඒක නිසා දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බවට පත් වී තිබෙන මහින්ද රාජපක්ෂ මැතිතුමා, ඔහු විසින්ම ආවේශ වෙලා, ඔහු විසින්ම ලෝගුවක් කරේ දාගෙන, ඔහු විසින්ම චරිතයට පණ පොවලා, අග්‍රාමාත්‍ය තනතුරකට පණ පොවනවා. ගරු කථානායකතුමනි, අපට කමක් නැහැ, ඕනෑ නම් කඩුව ඉනේ ගහගෙන, ඔටුන්නක් ඔළුවේ දාගෙන සෙල්ලම් ගෙදරක අගමැති වුණාට. අපට ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ගරු කථානායකතුමනි, රටේ අග්‍රාමාත්‍යවරයා හැටියට මේ කටයුතු කරන්නේ. වියදම් කරන්නේ මහා භාණ්ඩාගාරයේ සල්ලි; මේ රටේ මහජනයාගේ බදු සල්ලි. අග්‍රාමාත්‍යවරයෙකු නොවෙන කෙනෙක් අග්‍රාමාත්‍යවරයෙකුට පැවරී තිබෙන වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් මහජනයාගේ භාණ්ඩාගාරයෙන් වියදම් කරමින් තිබෙනවා නම්, මේ පාර්ලිමේන්තුවට යුක්ති සහගත අයිතියක් තිබෙනවා, එම වැය ශීර්ෂය කප්පාදු කරන්න; ඒ වැය ශීර්ෂය නතර කරන්න. අන්න, ඒ වෙනුවෙන් තමයි මේ යෝජනාව ගෙනැත් තිබෙන්නේ.

මේ යෝජනාවෙන් නැවතත් අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට පෙන්වා දී තිබෙන්නේ මොකක්ද? ඔබතුමා විසින් මේ ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරන එකෙන් තව තවත් අර්බුදය දිග් ගස්සනවා. කරුණාකරලා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ව්‍යවස්ථාවට යටත් විය යුතුව තිබෙනවා. හැබැයි, ඒ වාගේම මම එක කාරණයක් මතක් කරන්න ඕනෑ. දැන් මේ අටවා ගන්නා ලද අග්‍රාමාත්‍යවරයාට ඒ බලතල සහ වරප්‍රසාද හිමි වෙන්නේ නැතුවා වාගේම හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහත්තයාට ඒ බලතල සහ වරප්‍රසාද අහිමි බවත් තේරුම් ගත යුතුව තිබෙනවා. -ඒකට නම් අත්පුඩිය නැහැ වාගේයි. - ඒක තේරුම් ගන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මොකද, ඒ වියදම් කොහොමද, කෙරෙන්නේ? මම දැක්කා, අරලියගහ මන්දිරයේ ඊයේ - [ඝෝෂා කිරීම්] ගරු කථානායකතුමනි, අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාවක් තිබෙනවා. එම ප්‍රධාන ශාලාවේ - එක්සත් ජාතික පක්ෂ පළාත් පාලන මන්ත්‍රීවරුන් කැඳවලා තිබෙනවා. එතකොට ඒක දේශපාලන රැස්වීමක්. අපේත් පළාත් පාලන මන්ත්‍රීවරුන් කැඳවනවා. අපි කැඳවන්නේ අපේ පක්ෂ කාර්යාලයේ. ඔබතුමන්ලා සිරිකොතේ මන්ත්‍රීවරුන් කැඳෙව්වා නම්, අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඔබතුමන්ලා කැඳවන්නේ අරලියගහ මන්දිරයේ. එතකොට electricity bill කොහෙන්ද, ඒ ශාලා ගාස්තු කොහෙන්ද? ඒ කෑම-බීම? මම දන්නේ නැහැ, කෑම-බීම කොහොමද, දෙන්නේ කියලා. ඒවාට නම් අනුග්‍රාහකයෝ ඇති කියලා මම හිතනවා. [බාධා කිරීම්]

කෙසේ වුවත්, ගරු කථානායකතුමනි, දැන් රාජ්‍ය දේපොළ තැන් දෙකක පාවිච්චි වෙනවා. ගරු කථානායකතුමනි, දැන් මේ රටේ ජනතාවට වෙලා තිබෙන්නේ මේ රාජ්‍ය යන්ත්‍රණයත්, මේ දේශපාලන යන්ත්‍රණයත් නඩත්තු කරන්නයි. ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාව ඒ සඳහා විශාල වැය බරක් දරනවා. ඒක අප විසින් දිගින් දිගටම පෙන්වා දෙනු ලැබුවා. මේ රටේ ජනතාව මේ ආණ්ඩුවක් නඩත්තු කරන්න මේ තරම් වැය බරක් දැරිය යුතු නැහැ. ඒක යුක්තිසහගත නැහැ. අපි එය අනුමත කරනවාද? මේ වාගේ කුඩා රාජ්‍යයක, මේ වාගේ කුඩා ආර්ථිකයක් තිබෙන රටක, මේ වාගේ ආර්ථික අර්බුදයක් තිබෙන රටක ආණ්ඩුවක් නඩත්තු කිරීම වෙනුවෙන් මේ රටේ ජනතාවගේ බදු මුදල් කොච්චර ප්‍රමාණයක් අපි වියදම් කළ යුතුද? ඒ නිසා අද අපට, මේ රටේ ජනතාවට, සිදු වී තිබෙනවා, ජනතාවගේ සහන, ජනතාවගේ ආර්ථිකය කෙසේ වෙතත්, ආණ්ඩුවක් නඩත්තු කරන්න; ආණ්ඩුවක් වෙනුවෙන් බදු ගෙවන්න. ආණ්ඩුවක බර කර ගහගන්න වෙලා තිබෙනවා, මේ රටේ ජනතාවට.

ගරු කථානායකතුමනි, එක ආණ්ඩුවක බර කර ගහන ජනතාවට, අගමැතිවරුන් දෙදෙනෙකුගේ බර කර ගහගන්න වුණොත්, ඇමතිවරුන් කණ්ඩායම් දෙකක බර කර ගහගන්න වුණොත්, මේ තත්ත්වය තවත් තීව්‍ර වෙනවා. එක අග්‍රාමාත්‍යවරයෙකුගේ බර කර ගහගත්තු රටේ ජනතාවට අද අගමැතිවරුන් දෙදෙනෙකුගේ බර කර ගහගන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, එය කිසිසේත්ම යුක්තිසහගත නැහැ. මෙම යෝජනාවේ සදාචාර සම්පන්නභාවය එක්සත් ජාතික පක්ෂය අපේක්ෂා කරනවා නම්, මෙම යෝජනාව සම්මත වූ වහාම අරලියගහ මන්දිරයේ දේශපාලන වැඩ කටයුතු අනෙකුත් කටයුතු අත්හරින්න ඕනෑ. ඒක තමයි ශුද්ධභාවය. අගමැති නොවන මහින්ද රාජපක්ෂ මහත්මයාගේ වැය ශීර්ෂය කපනවා නම්, කපන්නවත් වැය ශීර්ෂයක් නැති හිටපු අග්‍රාමාත්‍යවරයාගේ නඩත්තුවීමත් අපි දැරිය යුතුද? ඒ නිසා මේ යෝජනාව සද්භාවයෙන් නම්, රාජ්‍ය මුදල් පිළිබඳව නම්, මහජනයාගේ බදු මුදල් අනිසි ලෙස වියදම් කිරීමට එරෙහිව සද්භාවයෙන් ගෙනෙන යෝජනාවක් නම්, යෝජනාව සම්මත වූ වහාම අරලියගහ මන්දිරයෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයාද ඉවත්ව යා යුතුයි කියලා අපි යෝජනා කරනවා. දැනට මුදල් කපන්නේ මේ කාරණය සම්බන්ධවයි. ඒ නිසා ඒ පිළිබඳව යෝජනා කරමින් ගරු කථානායකතුමනි, මුදල් පිළිබඳ සද්භාවයටත් - [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දෙකම වෙන්න ඕනෑ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ දෙකම එකට. දෙකම එකට!

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පළමු කරුණ ඉස්සරවෙලා එන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කමක් නැහැ. ගරු කථානායකතුමනි, එක මොකක්ද, දෙක මොකක්ද කියන එකට වඩා මට වැදගත් මෙයයි. මේ මහජනයාගේ බදු සල්ලිවලින්, දෙපැත්තකින් -මූලස්ථාන දෙකකින්, ස්ථාන දෙකකින්- නඩත්තු වෙන එක නොකළ යුතුව තිබෙනවා. ඒ නිසා අපි මෙතැන ආණ්ඩුවට ව්‍යවස්ථානුකූලව යම් ප්‍රහාරයක් එල්ල කරනවා වාගේම, ජනාධිපතිවරයාට ව්‍යවස්ථාවට නැවත යටත් වෙන්න කියලා බලපෑමක් කරනවා වාගේම, රාජ්‍ය මුදල් භාවිත කරන්නේ කොහොමද කියන ආදර්ශයත් අපි ලබා දිය යුතු වෙනවා. ඒ කාරණාවත් සම්පූර්ණ වීම අපේක්ෂා කරමිනුයි මේ යෝජනාව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ සහාය ලබා දෙන්නේ. ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ කථාවේ සඳහන් වුණා, අරලියගහ මන්දිරයේ වියදම් සම්බන්ධව. විශේෂයෙන් ඊයේ දින රැස්වීම ගැන. ඒ වියදම් අපියි දරන්නේ. ලයිට් බිල් වියදමත් අපියි දරන්නේ. හැකි තරම් අපේ පෞද්ගලික ආධාරකරුවන්ගේ මුදල්වලින් අපි ඒ වියදම් දරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අපි වාදයකට යන්නේ නැතිව-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මම ලොකු විවාදයකට යන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, එහෙම නම් මම එතුමාගෙන් දැන ගන්න කැමැතියි, අරලියගහ මන්දිරය ඕනෑම කෙනකුට කුලියට ලබා දෙන හෝටලයක් වාගේ තැනක්ද කියලා. එපමණයි, මට දැන ගන්න ඕනෑ. එහෙම දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණට අවශ්‍ය නම් අපි ඒ අයටත් ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු රවුෆ් හකීම් මැතිතුමා.

[11.26 a.m.]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

Hon. Speaker, we listened to my Friend, the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, the learned President's Counsel and a controversial Minister in this illegal Government. I must put certain things in the correct perspective, though I am not at cross-purposes with the purpose with which he made that speech. But, certain matters have to be put in the correct perspective to clear the doubts that may arise in the minds of the general public of this country.

Firstly, Sir, he being a leading lawyer in the country and a long-time Legislator in this House knows the concept of separation of powers and that the three important institutions of the State, namely the Executive, the Parliament and the Judiciary, have their own competencies. The need to have a careful balance between the competencies of all these three institutions is the paramount objective of all law-abiding citizens. The office bearers of these institutions, those who hold office, have to be mindful of the fact that each do not trespass on the competency of the other. If that does not happen, none of these problems could have arisen. So, this happened little realizing that the Nineteenth Amendment was meant to curtail the powers of the Executive President in a certain manner.

I also, in the meantime, put in the matter that arose out of the Hon. Anura Dissanayake's contention of the Hon. Ranil Wickremesinghe occupying the Temple Trees. We say the decision by the President to remove the Hon. Ranil Wickremesinghe is *void ab initio* and that matter is now before the Supreme Court through another petition that has been filed and is to be supported soon. Therefore, we cannot come to the conclusion that the Hon. Ranil Wickremesinghe is illegally occupying the Temple Trees. He has been one who had always respected the verdict of the people and very honorably left the Temple Trees when the verdict of the people was otherwise. Here, when the Executive President has unlawfully and unconstitutionally removed the Prime Minister, it is the Hon. Ranil Wickremesinghe's contention and our contention too that he can remain there as the legal occupant unless the court holds otherwise. And I would dare say that we would even be willing to replenish all the damages or whatever the cost that might incur out of wrongful occupation of the Temple Trees, if the court holds otherwise.

So, Sir, on the issue of one institution of the State trespassing the competency of the other, we are in a very grave situation today. This has to be rectified. I fully understand the purpose underlying the statement by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe. We appreciate that. It is up to you, Sir, whether to consider such a reconciliation and bring to conclusion this unnecessary confrontation. You are not the first Speaker who has had to face such a difficulty; several of your predecessors had to face similar problems. Particularly after the enactment of the 1978 Constitution, we have had several instances where this House and the Executive were at each other's throat not knowing whose competency they were trampling upon.

Therefore, we can always reconcile these differences. But, the facts as to whether who unconstitutionally abused the powers that were sought to be conferred on them is a matter that we have to seek clarification from

the Judiciary. There is no other place than the Supreme Court of this country for us to go to seek interpretation of the Constitution. So, we have had to seek the intervention of the Supreme Court since, in the long list of constitutional violations, His Excellency the President sought to dissolve Parliament and since we consider that dissolution once again *void ab initio,* we have challenged it in court and we had no other alternative. Therefore, that is not a matter for judicial purview of the House. Of course, courts exercise judicial power through Parliament. But, that does not mean that we can just fold our arms and wait when the Executive takes a decision to dissolve Parliament totally unlawfully and unconstitutionally. Therefore, our resort to judicial remedy was totally justified in those circumstances.

Quite apart from that, if there is a move to reconcile the differences, we can always try and sort them out. Since you are the custodian of our rights, Sir, you are fully within your rights to negotiate and bring this to an acceptable solution since it has a severe impact on the economy. There has been no Government for the last 30 days in this country. There has been an illegal Government put in place and the purported Government does not have the guts to face the people and in the pretext of boycotting this House, they are turning their backs on the people of this country. I consider the Hon. Mahinda Rajapaksa also as a great democrat and he himself knows through his own conscience what he is doing is wrong. These two people, the Hon. Ranil Wickremesignhe and the Hon. Mahinda Rajapaksa, had been longstanding Hon. Members of this august Assembly since the '70s. Who came first and who came last is not the issue. But the fact is, both of them have had sufficient experience within the House to know the basic tenets of the law and the basic positions enunciated by the Constitution.

Therefore, Sir, putting those matters in the right perspective, I urge you to act according to your conscience in resolving this unnecessary confrontation that has arisen because of the illegal, unconstitutional actions that had been taken by certain bearers of constitutional office.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු බිමල් රත්නායක මැතිතුමා.

[පූ.භා.11.36]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අනුව මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයා අග්‍රාමාත්‍ය තනතුරට හිමි රාජ්‍ය මුදල් දැන දැන අවභාවිත කිරීමක් සිදු කර තිබෙනවා. ඔහු මේ රටේ හිටපු ජනාධිපතිවරයෙක්; හිටපු අගමැතිවරයෙක්. එතුමා මේ ගරු සභාවේදීම කිව්වා, එතුමා කුඩා කල සිටම පාර්ලිමේන්තුවේ හිටියා කියලා. ඒ නිසා එතුමා හොඳින්ම දන්නවා එතුමා මේ කරන්නේ නීතිවිරෝධී දෙයක් කියලා. ඒ නිසා එතුමා රාජ්‍ය මුදල් දැන දැන අවභාවිත කිරීමක් කර තිබෙනවා ඔක්තෝබර් 26 සිට අද දක්වා. ඒ නිසා මේ යෝජනාවට අනුව අදින් පටන් ගත්තාට පස්සේ මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයාගේත්, ඒ නීතිවිරෝධී, අනීතික ආණ්ඩුවේ "ඇමතිවරුන්" කියලා හඳුන්වා ගන්නා අනෙකුත් මන්ත්‍රීවරුන්ගේත් මුදල් කප්පාදු කිරීමට ජනතා විමුක්ති පෙරමුණේ අපි සහයෝගය ලබා දෙනවා; ඒකට ඉදිරිපත් වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, මුදල්වලට වඩා මේවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ පොදුජන පෙරමුණේ තනතුරු නොවෙයි. මේවා මේ රටේ තනතුරු. මේ රටේ තනතුරු තමයි අද මේ වන විට යම් මන්ත්‍රී කණ්ඩායමක් බලහත්කාරයෙන්, වැරැදි බව දැන-දැන පාවිච්චි කරන්නේ. ගරු කථානායකතුමනි, නොදැන කරන වැරැදිවලට වඩා දැන-දැන කරන වැරැදි බලවත්. මේ මුදල් කප්පාදු කිරීම අත්‍යවශ්‍ය වන්නේ ඒ නිසායි. මා නැවත කියනවා, අද මේ දූෂිත, තක්කඩි ආණ්ඩුව බලයේ ඉන්නේ, තවමත් බලය අල්ලාගෙන ඉන්නේ කිසි බලයකින් නොවෙයි කියලා. මෙය සිද්ධ වුණු දවසේම ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි කිව්වා, "මේක අපි පරද්දනවා"යි කියලා. මොකද, පක්ෂයක් වශයෙන් අපි යම් දෙයක් පිළිබඳව නිකම් විසඳුම්, තීරණවලට එන්නේ නැහැ. අපි ගැඹුරින් සාකච්ඡා කරලා, එහි අනාගතය දැකලා තමයි මැදිහත් වෙන්නේ. අපි කිව්වා, "මේක වැරැදියි" කියලා. අපි කිව්වා, "මේක පරද්දනවා"යි කියලා. දැනට මේ ක්‍රියාව අධිකරණයේදී අර්ධ වශයෙන් පැරදිලා තිබෙනවා, ව්‍යවස්ථාදායකයේ දිගටම පරදිනවා, පරද්දලා තිබෙනවා, ජනතාව අතර පැරදිලා තිබෙනවා, ඒ වාගේම ලෝකයේ රටවල් අතර පැරදිලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා.

දැන් කියනවා නේ, බටහිර රටවල්වලින් තමයි මේ ක්‍රියාවට විරුද්ධවෙලා තිබෙන්නේ කියලා. බටහිර රටවල් සම්බන්ධ ප්‍රශ්නය අපි වෙනම සාකච්ඡා කරමුකෝ. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ඉතා මිත්‍රශීලි රටක් තමයි ස්වාසිලන්තය. දැන් ස්වාසිලන්තය මෙය පිළිගෙන තිබෙනවාද? මාලදිවයින මෙය පිළිගෙන තිබෙනවාද? මේ කුමන්ත්‍රණයට දවස් 5කට කලින් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සීෂෙල්ස් රටට ගියා. ඒ රට මෙය පිළිගෙන තිබෙනවාද? දකුණු ආසියාවේ එක රටක් හෝ පිළිගෙන තිබෙනවාද? පිළිගෙන නැහැ. ඒ නිසා ගරු කථානායකතුමනි, මෙය අධිකරණය තුළ, ව්‍යවස්ථාදායකය තුළ, ජාත්‍යන්තරය තුළ විතරක් නොවෙයි, ජනතාව තුළත් පැරදිලායි තිබෙන්නේ. මා කියන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේදී මේ රටේ ජනතාවගේ හෘදය සාක්ෂිය කුමාර වෙල්ගම මන්ත්‍රීතුමාගේ හෘදය සාක්ෂියට වඩා අඩු ගණනේ එක අඩියක් හෝ ඉස්සරහින් තිබෙනවා. මොකද, සමහර අය කියනවා නේ, "ජන මතය තිබෙනවා, රාජපක්ෂට මිනිස්සු කැමැතියි" කියලා. නමුත් අපි පැහැදිලිව කියන්න කැමැතියි, රටේ ජනතාව කුමාර වෙල්ගම මහත්මයාට වඩා අඩුම ගණනේ අඩියක් ඉස්සරහින් ඉන්නේ කියලා. මේ ක්‍රියාව ජනතාව තුළත් පැරදිලායි තිබෙන්නේ. එහෙම නම් අද බලයේ ඉන්නේ කොහොමද? අද මේ ඇමති ධුර දරන්නේ කොහොමද? අපි ඉතාම පැහැදිලිව කියන්න ඕනෑකම තිබෙනවා, මේ ඇමති ධුර දරන්නේ "කළු මාධ්‍ය ජාලයක" බලයෙන් කියලා. රාජපක්ෂලා හදපු, ඒ මත යැපෙන මෛත්‍රීපාල සිරිසේන එක්ක බිස්නස් කරන කළු මාධ්‍ය ජාලයක බලයෙන් තමයි අද මේවා කරන්නේ.

දැනුත් SMS alert එන්නේ කොහොමද? දැනුත් alert එන්නේ කොහොමද? "අමාත්‍ය" කියලා. දැනුත් alert එන්නේ එහෙමයි. ගරු කථානායකතුමනි, මේ රටේ දූෂිත, තක්කඩි, නීති විරෝධී පාලනය දුවන්නේ ඔය එහාට මෙහාට පනින සහ පනින්න

[ගරු බිමල් රත්නායක මහතා]

ඉන්න කට්ටිය මත නොවෙයි කියන එක අද අපට හරි පැහැදිලියි. ඒ පාලනය දුවන්නේ තනිකරම කළු මාධ්‍ය ජාලයක බලයෙන්. ජනාධිපතිවරයා මේ වැඩසටහන පටන් ගත්තේ කුමක් වෙනුවෙන්ද? ගරු කථානායකතුමනි, අපේ රටට මේ කුමන්ත්‍රණයෙන් ලැබී තිබෙන ප්‍රතිඵලය මොකක්ද?

රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව මේ පාර්ලිමේන්තුවට පොරොන්දු වෙලා තිබෙනවා, හම්බන්තොට වරාය විකුණන්න කලින් ඒ බදු ගිවිසුම පිළිබඳ සාකච්ඡා කරනවා කියලා. ඒ පොරොන්දුව කඩන වේලාවේවත් "මම හම්බන්තොට වරාය විකිණීම නතර කිරීමට තමයි මේක කළේ" කියලා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කිව්වා නම් අඩු ගණනේ අපට ටිකක් පිළිගන්න පුළුවන්, හිතන්න තිබුණා විකුණා ගන්න පුළුවන් බොරුවක් කියනවා කියලා. එතුමා විධායක බලතල කිසිවක් රට වෙනුවෙන් පාවිච්චි කළේ නැහැ. එතුමාගේ විධායක බලතල රට වෙනුවෙන් වැදගත් දෙයකට පාවිච්චි වුණේ නැහැ. ගරු කථානායකතුමනි, එතුමා විධායක බලතල පාවිච්චි කළේ මොකටද? SriLankan Airlines එකේ කජු නරක් වුණාම, ඒ කජු සැපයුම්කරුවා එළවන්න පාවිච්චි කළා. මේ පාර්ලිමේන්තුවේ හිටපු වැදගත් මහ ලේකම්වරියක් -මම හිතන විධියට ලංකාවේ පාර්ලිමේන්තුවේ පළමුවැනි මහ ලේකම්වරිය- වන ප්‍රියානි විජේසේකර මැතිනිය- ඔස්ට්‍රියාවේ තානාපති වශයෙන් පත් කළා. ජනාධිපති ඔස්ට්‍රියාවේ තානාපති කාර්යාලයට ටෙලිෆෝන් කරද්දී, එතුමිය සහ ඒ කාර්ය මණ්ඩලය ටෙලිෆෝන් එකට කථා කළේ නැහැ කියලා ඒ තානාපතිවරිය පමණක් නොවෙයි, ඒ බ්‍රයිවර්ස්ලාත් ලංකාවට ගෙන්නුවා. ඔන්න ජනාධිපති විධායක බලතල පාවිච්චි කරපු දෙවැනි අවස්ථාව. ඊට පස්සේ එතුමා තව මොනවාටද විධායක බලතල පාවිච්චි කළේ? 'සිංහරාජයේ අලි දෙදෙනෙක් ඉන්නවා, ඒ අය එතැනට ප්‍රශ්නයක්' කියලා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කියද්දී, එම අලි දෙදෙනා සිංහරාජයේම තියන්න විධායක බලතල පාවිච්චි කළා. වෙන මොනවාටද ගරු කථානායකතුමනි, එතුමා විධියක බලතල පාවිච්චි කළේ? රටේ ආරක්ෂාව වෙනුවෙන්, ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම නතර කරන්න, හම්බන්තොට වරාය බදු දීම නතර කරන්න -ඒ එකකටවත් - ඒ බලතල පාවිච්චි කළේ නැහැ. තව දෙයකට විධායක බලතල පාවිච්චි කළා. ඒ තමයි, හොරු රකින්න. එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඉවත් කළේ මොකටද?

දරුවන් එකොළොස්දෙනෙක් පැහැරගෙන ගිහිල්ලා කප්පම් ඉල්ලපු අය ඉන්නවා. මෙය යුද්ධයට සම්බන්ධ කථාවක් නොවෙයි. යුද්ධය වෙනුවෙන් වුණත් එහෙම කරන එක වැරැදියි. කප්පම් ගන්න ඒ දරුවන් පැහැර ගන්න කටයුතු කරපු අය ආරක්ෂා කිරීමට තමයි විධායක බලතල පාවිච්චි කළේ. මොකක්ද ඒ වෙලාවේ කළේ? සැකකරු අත්අඩංගුවට ගන්න කියලා උසාවි නියෝගයක් ලබාදී තිබියදී -අධිකරණයේ ඒ විනිශ්චයකාරතුමන්ලාට කොන්දක් තිබීම ගැන අපි සතුටු වෙනවා- ජනාධිපතිගේ විශේෂ නියෝජිතයා වශයෙන් ඔහු මෙක්සිකෝවට යැව්වා, මීට මාසයකට කලින්. එහෙමයි ගරු කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා තමන්ගේ විධායක බලතල පාවිච්චි කළේ.

දැන් අපට පෙනෙනවා 'ඩීල්' එකක් පටන් ගෙන තිබෙන බව. ගරු කථානායකතුමනි, මීට සතියකට දෙකකට කලින් අපි දැක්කා, පිළිකාවක් වාගේ මන්ත්‍රී කණ්ඩායමක් මෙහි ඉන්න බව. මේ පාර්ලිමේන්තුව අධම තත්ත්වයට පත් වෙලා. උදයට පනින, සවසට පනින, රෑට පනින අමු තක්කඩි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක වුණේත්, මන්ත්‍රීවරුන්ට පක්ෂ මාරු කළ නොහැකියි කියන සංශෝධනය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අවස්ථාවේ ගෙන ඒමට නොහැකි වූ නිසා. එය ඒ සංශෝධනවල තිබුණා. දෙගොල්ලෝ කථා කරලා එය ඉවත් කර ගත්තා. අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට නැවත ඒක ගෙනාවා. මේ අය උදේට පනිනවා, හවසට පනිනවා. අද සමහර අයට කියනවා එයාගේ සීයා ඒ කියන "ජාතියේ" එක්කෙනාගේ නොවෙයි "අශ්වයාගේ" කියලා. එහෙම කියනවා. අද රටේ මිනිස්සු තමයි එහෙම කියන්නේ; මන්ත්‍රීවරු නොවෙයි. දැන් ඊට වඩා කෙනෙක් පනින්න ලෑස්ති වෙලා ඉන්න බව පෙනෙනවා. ඒ ගොල්ලන්ගේ සීයලා කැන්ගරුද කියලා සොයාගන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපි මිනිසුන්ට ගරු කරනවා. මිනිසුන්ගේ දේශපාලන ප්‍රතිපත්ති සම්බන්ධ අපේ විවේචන තිබෙන්න පුළුවන්. නමුත් අපි මිනිසුන්ගේ පෞරුෂයට, පෞද්ගලිකත්වයට ගරු කරනවා. ඔවුන් දරන දේශපාලන අදහස් කුමක් වුවත් අපි ගරු කරනවා. නමුත් මේ මොකක්ද? මේ පිළිකාවක්නේ. ගරු කථානායකතුමනි, අපට ප්‍රශ්නයක් නැහැ ආණ්ඩුවක් කඩා ගන්න පනින එක ගැන. නමුත් මේ කඩලා තිබෙන්නේ මේ මාතෘ භූමියේ ප්‍රතිරූපය. දැන් එහාට මෙහාට පැනලා තමන්ගේ වැරදි නිවැරදි කරගන්න කථා කරන උදවියත්, තව එන්න ඉන්න කට්ටියත් -දෙපැත්තටම- මාස දෙකක් තිස්සේ මේ රටට කරපු damage එකට, විනාශයට ගෙවන්නේ කොහොමද? තමන් පනින්න ගත්ත සල්ලිවලින් මේ වෙච්ච විනාශය වෙනස් කරන්න පුළුවන්ද? ගරු කථානායකතුමනි, අපට තිබෙන ප්‍රශ්නය ඒකයි. අපි ඒකයි කියන්නේ සහමුලින්ම මෛත්‍රීපාල සිරිසේන මහතා එතුමාගේ වැරැද්ද නිවැරදි කර ගත යුතුයි කියලා. එතුමා ජාතියෙන් සමාව ගත යුතුයි. මම මේ කියන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව එළවපු එක ගැන නොවෙයි. ඒක කොහොමත් එළවන්නට තිබ්බ ආණ්ඩුවක්, ඡන්දයකදී. නමුත් ජනාධිපතිවරයා දෙවැනි වතාවේත් ජනාධිපති ධුරයට පත් වීම සඳහා කරපු කුමන්ත්‍රණය හේතුවෙන් මේ රටේ ආර්ථිකයට, ප්‍රතිරූපයට, ලෝකය ඉදිරියේ අපට වෙච්ච හානියට, වෙච්ච අලාභයට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ගෙවනවාද? එහේට මෙහේට පැනිලිවලින් ඒ හානිකර තත්ත්වය වෙනස් වෙනවාද? ඒ තත්ත්වය වෙනස් වෙන්නේ නැහැ ගරු කථානායකතුමනි. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් යම් කිසි ගරුත්වයක් ඇති වුණා, මේ පාර්ලිමේන්තුවේ වැඩි මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ඒ විකිණෙන බිස්නස් එකට ගියේ නැති නිසා.

මම දන්නේ නැහැ, ඉන්න සල්ලි ගත්තාද නැද්ද කියලා. නමුත්, විකිණුණා කියලා අපට පෙනුණු ප්‍රමාණය විකිණුණු ප්‍රමාණයට වඩා අඩුයි. ඒ වාගේම ඔබතුමාගේ ක්‍රියාමාර්ගයත් අපි අගය කරනවා. ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. නමුත්, ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ගය අපි අගය කළා. ඔබතුමා මේ ගරු සභාවට පොලිස් ආරක්ෂාව මැද්දේ ඇවිල්ලා පාර්ලිමේන්තුවේ උත්තරීතරභාව රකිනකොට, අද මේ පනින්න ඉන්න පුද්ගලයෝ හිටියේ කොතැනද? ඒ ත්‍රස්තවාදී අමු කැත වැඩේට දායකත්වය දක්වමින් ගරු කථානායකතුමනි. එක්සත් ජාතික පක්ෂයට ඒ අයව එකතු කරගෙන රෙදි ඇඳගෙන - රෙදි නැතිවද මම දන්නේ නැහැ- ආණ්ඩු හදා ගන්න පුළුවන් නම්, ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. මම කියන්නේ එක්සත් ජාතික පක්ෂයට දැන් කුමාර වෙල්ගම කෙනෙක් ඕනෑ. අපිට නම් රෙදි ඇඳගෙන ඒ වාගේ අයත් එක්ක ආණ්ඩු කරන්න බැහැ. ඔබතුමාට ආණ්ඩුවක් හදා ගන්න තිබෙන අයිතිය ගැන නොවෙයි අපි මේ ප්‍රශ්න කරන්නේ. කුමාර වෙල්ගම කෙනෙක් එක්සත් ජාතික පක්ෂයේ නැද්ද, කියන්න.

ගරු කථානායකතුමනි, අපි කියන්නේ ඒ නිසා වහාම මේ පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් හරි විශේෂ කාරක

සභාවක් හරි පත් කරන්න ඕනෑ කියලායි. මෙකේ balance එක රකින්න අවශ්‍යතාවක් නැහැ, තක්කඩියොත් එක්ක. අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මෙය සහමුලින්ම ජනාධිපතිතුමා විසින් කරන ලද ව්‍යවස්ථා විරෝධී, නීති විරෝධී, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක්. මම ජනාධිපති නීතිඥයෙක් නොවෙයි. මම නීතිඥයෙක්වත් නොවෙයි. නමුත්, මේ කුමන්ත්‍රණයේ මුල් කාලයේ දී මේ ගැන අර්ථ දක්වද්දි, සාමාන්‍ය තරුණ ළමයි Facebook එකේ දාලා තිබෙන අදහසක් මා දැක්කා. දෙපැත්තේ නීතිඥයන් ව්‍යවස්ථාව අර්ථ දක්වන විධියට හිතෙනවා කියලා, හිරේ ඉන්න අයගෙන් සියයට 90ක්ම හිරේ ඉන්නේ වැරදියට කියලා. ගරු කථානායකතුමනි, මම අහලා තිබෙනවා උසාවියේ කටයුතුවලදී සාමාන්‍යයෙන් ජනාධිපති නීතිඥයන්ට කියන්නේ PC කියලා. එතකොට සාමාන්‍යයෙන් බලවත් පුද්ගලයන් වෙනුවෙන් PC කෙනෙක් ඉදිරිපත් වෙනවා. දුප්පත් පුද්ගලයන් වෙනුවෙනුත් PC කෙනෙක් ඉදිරිපත් වෙනවා, ඒ තමයි පොලිස් කොස්තාපල්. අනෙක් පැත්තෙන් ඉදිරිපත් වෙන්නේ President's Counsel. හැබැයි, දැන් මට හිතෙනවා, President's Counsel කියන එකේ; PC කියන එකේ ඇත්ත තේරුම ඒකත් නොවෙයි කියලා. එහි ඇත්ත තේරුම "පනින කවුන්සල්" කියලා මට හිතෙනවා. ගරු කථානායකතුමනි, අපි නීතිඥයන් නොවෙයි. අපට තේරෙන්නේ සාමාන්‍ය හොඳ නරක විතරයි. ඒක අපේ අම්මලා, තාත්තලාගෙන්, අපේ පක්ෂයෙන්, අපේ පාසල්වලින්, අපේ රටේ සාමාන්‍ය පුංචි මිනිසුන්ගේ හෘද සාක්ෂියෙන් අපි ඉගෙන ගත් දේවල්. අපට විකිණෙන්නේ නැතිව කොන්දක් තියාගෙන කෙළින් කථා කරන පෞරුෂය ලැබිලා තිබෙන්නේ ඒ අයගෙන්.

මේ ව්‍යවස්ථා විරෝධී කුමන්ත්‍රණය අද සමාජගත වෙලා තිබෙන්නේ කොහොමද?

අද ජනමාධ්‍යයෙන් - කළු මාධ්‍ය වළල්ලෙන් - මේ කරපු වැරැද්ද තමයි සාධාරණීකරණය වෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මාසයක විතර කාලයක් හෝ වෙන් කරලා, රටේ උගතුන් පාර්ලිමේන්තුවට කැඳවා සාකච්ඡා කරන්න. හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් කැඳවන්න. දැන් ඉන්න ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් ගෙන්වන්න බැරි නිසා. අර මෛත්‍රීපාල මහත්මයාට වඩා නිවැරදි නීති උපදෙස් ලබා දුන් කෙනා වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] එයා ගැන තමයි මම කිව්වේ. මේ රටේ දැවැන්ත සාකච්ඡාවක් පාර්ලිමේන්තුව මැදිහත් වෙලා ඇති කරන්න ඕනෑ. පාර්ලිමේන්තු කාරක සභා ඇති කරලා, රටේ උගතුන් කැඳවා එවැනි සාකච්ඡාවක් කරන්න ඕනෑ. අපට නොවෙයි. මේ රටේ විශිෂ්ට උගතුන්ට අවස්ථාවක් දෙන්න ඕනෑ, මේ කුමන්ත්‍රණය ව්‍යවස්ථානුකූලව කොතරම් වැරදිද කියලා සාකච්ඡා කරන්න. අපේ රටේ නීති විද්‍යාලයේ උගන්වන්න පටන් ගන්න ඕනෑ කියලා අපි යෝජනා කරනවා, මේ කුමන්ත්‍රණය ව්‍යවස්ථානුකූලව කොතරම් වැරැදිද කියලා. අපි කියන්නේ ඒකයි.

ගරු කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන මහතා සමඟ අපට නම් මේ ප්‍රශ්නය සම්බන්ධව කථා කරන්න දෙයක් නැහැ. මේ පූර්වාදර්ශය සදහටම, සදහටම delete කරන්න ඕනෑ. සදහටම මේක බිංදුවට ගෙනෙන්න ඕනෑ. මේක හරියට හිට්ලර්ගෙන් පස්සේ ජර්මනියේ පටන් ගත්ත "denazification" කියන overall campaign එක වාගෙයි. එම denazification campaign එක නීතියට ගෙනාවා; පොලීසියට ගෙනාවා; පාසලට ගෙනාවා; විශ්වවිද්‍යාලයට ගෙනාවා. ගරු කථානායකතුමනි, ඔබතුමා මට වඩා හොඳින් ඒ ගැන දන්නවා. මොකද, ඔබතුමා ජර්මනියේ හිටපු තානාපතිවරයෙක්. ඒ වැරැද්ද සහමුලින්ම ජනගත කළා. දරුවන්ගේ ජානවලට ඇතුළු කළා. ගරු කථානායකතුමනි, මම කියන්නේ මේකයි. අපට හඳුන්වා දුන් මේ පූර්වාදර්ශය, මේ කුමන්ත්‍රණය කළේ කවුද? පාර්ලිමේන්තුවේ බලය නැති කුලියට ජනාධිපතිකම කරන ජනාධිපති කෙනෙක්. කුලියට කියන්නේ, එක්සත් ජාතික පක්ෂයේ ඡන්දවලින් සහ සියයට 50ක් තමන්ට අයිති නොවන ඡන්දවලින් ජනාධිපති වෙච්ච කෙනෙක් මේ. ඒ කියන්නේ, මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපති ධුරයට පත් වුණා වාගේ හෝ චන්ද්‍රිකා මැතිනිය පත් වුණා වාගේ නොවෙයි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජනාධිපති ධුරය. එතුමා ඒක කළේ, කුලියට. ඒක, එතුමාගේ හයියෙන් ගත්ත එකක් නොවෙයි. අඩු ගණනේ සියය 90ක්? එහෙම ජනාධිපති කෙනෙකුට විධායක බලතල පාවිච්චි කරලා රටට මෙහෙම හානියක් කරන්න පුළුවන් නම්, දැනට ලබා දී තිබෙන මේ පූර්වාදර්ශය ජනතාවගේ මනසින් - අපේ මනසින් පවා - සහමුලින්ම ඉවත් කළේ නැත්නම් මොකද වෙන්නේ? මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපති ධුරයේ විධායක බලතල අහෝසි කරන්න අපට බැරි වුණොත්, ඊළඟට ජනාධිපතිවරයෙක් ආවොත් ඔහු පාර්ලිමේන්තුවේ බලයත් එක්ක කුමන දේ නොකරයිද? කුමන දේ නොකරයිද?

ගරු කථානායකතුමනි, මොවුන් පාවිච්චි කරන්නේ මොකක්ද කියලා ඔබතුමා දන්නවා. 2015 ජනවාරි 09වැනි දා රනිල් වික්‍රමසිංහ මහත්මයාට අගමැතිකම දුන්නු ආකාරය. දේශපාලන සදාචාරයට අනුව ඒක වැරදි බව අපි දන්නවා. ඒ වෙලාවේ නීතියට අනුව එකඟ වෙන්න පුළුවන්. නමුත්, ඒක තමයි මොවුන් පාවිච්චි කරන්නේ. ඒ වෙලාවේ වුණත් ඒකට නිසි ලෙස විරෝධයක් පළ වුණා නම්, ඒක වෙන විධියකට කර ගන්න තිබුණා; පාර්ලිමේන්තුවේ අනුමැතියෙන් කර ගන්න තිබුණා. රාජපක්ෂලා ඒ වෙලාවේ මැදමුලන ඉල්ලුවත් දෙනවා. ඒ නිසා රාජපක්ෂලා විරුද්ධ වුණේ නැහැ.

නමුත් අපි කියන්නේ, ප්‍රධාන වශයෙන් මේ පූර්වාදර්ශය සහමුලින් අතුගා දමන්න ඕනෑ කියලායි. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස. මේ dust එක settle වුණාම, මේ නීති විරෝධී තත්ත්වය සමනය වුණාට පසුව, පාර්ලිමේන්තුවේ යම් කිසි සංයමයක් ඇති වුණාට පසුව ඔබතුමා විශේෂ තේරීම් කාරක සභාවක් පත් කරලා, මේ රටේ නීතිය විනාශ වුණේ කොහොමද, ව්‍යවස්ථාව විනාශ වුණේ, පාර්ලිමේන්තු සම්ප්‍රදාය විනාශ වුණේ කොහොමද කියන එක පිළිබඳව හොඳ අධ්‍යාපනයක් රටට ලබා දිය යුතුයි.

දෙවනුව, රටට වුණු අලාභය. ගරු කථානායකතුමනි, රටට වුණු අලාභය දැන් ගෙවන්නේ කොහොමද? අරලියගහ මන්දිරයේ කරන අලාභය පමණක් නොවෙයි. ලෝකය ඉස්සරහ අපේ මාතෘ භූමියට තිබුණු ජාත්‍යන්තර ප්‍රතිරූපය අද අහිමි වීමේ අලාභය අපි ගෙවන්නේ කොහොමද ? අපි කියන්නේ, මුදල්මය සහ දේශපාලන වශයෙන් එය තක්සේරු කළ යුතුයි කියලායි. තක්සේරු කරලා, මේ කුමන්ත්‍රණයට දායක වුණු මෛත්‍රීපාල සිරිසේනගේ සිට, උපදෙස් දුන් අයගේ සිට, අද හෙට මෙහාට පනින්න හදන කට්ටියගෙන් පවා ඒ මුදල් අය කර ගත යුතුයි, ගරු කථානායකතුමනි. දැන් මේ අහෝසි වුණු සංචාරකයන්ගේ පැමිණීම, මාතෘ භූමියේ නම කැත වීම, ඒවා අපි නැවත උපයා ගන්නේ කොහොමද? ඒ නිසා, අන්න ඒ වෙනුවෙන් කාරක සභා දෙකක් පත් කරලා, පැහැදිලිවම මේ පූර්වාදර්ශය සහමුලින් අහෝසි කරන්න, ජනතාව දැනුවත් කරන්න කටයුතු කරන්න කියලා අපි යෝජනා කරනවා. ඊළඟට, මේ සිදු වුණු අලාභය මේ නීති විරෝධී කටයුත්ත කරපු පුද්ගලයන්ගෙන් අය කර ගන්න ඕනෑ.

විශේෂයෙන්ම මේ සටනේ දී අපි වැදගත්ම දෙය විධියට දකින්නේ මෙයයි. මේ රටේ නීතියට සහ ව්‍යවස්ථාවට අනුකූලව මෙය විසඳෙන්න ඕනෑ බව අපි කියන්න කැමැතියි. අපට පෙනෙනවා, දැන් එක්සත් ජාතික පක්ෂය - එළියේ යම් යම්

[ගරු බිමල් රත්නායක මහතා]

සාකච්ඡා කරන එක ගැන නොවෙයි මම කියන්නේ. එක්සත් ජාතික පක්ෂය දැන් මේ වැරැද්ද ජනගත කරන්න නොදී අතරමඟ, පිටස්තර ක්‍රියාමාර්ග හරහා, වෙන වෙන deal හරහා බේරා ගන්න හදන බව අපට පෙනෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ක්‍රමය ඒක වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දකින්න ඇති මේ රටේ අති විශිෂ්ට කලාකාරිනියන් පිරිසක්, උගත් කලාකාරිනියන් පිරිසක් ඊයේ තෙමි තෙමී ජනාධිපති ලේකම් කාර්යාලයට ගියා. ඒ, කාන්තාවන් පිරිස - මේ රටේ අම්මලා - තෙමි තෙමී ජනාධිපති ලේකම් කාර්යාලයට ගිහිල්ලා මොකක්ද කිව්වේ? UNP එකට ආණ්ඩුවක් හදලා දෙන්න කියලා නොවෙයි, ඒ අය කිව්වේ. මේ මාතෘ භූමියේ නම කෙළෙසන්න එපා කියලායි කිව්වේ. ගරු කථානායකතුමනි, ඔබතුමා පොලිස් ආරක්ෂාව මැද මෙතැනට ඇවිල්ලා මොකක්ද කළේ? මම විශ්වාස කරනවා, එක්සත් ජාතික පක්ෂයේ ඉන්න වෙනත් කිසිම මන්ත්‍රීවරයෙක් ඔය පුටුවේ හිටියා නම් ඒක කරන්නේ නැහැ කියලා. අගමැති වෙන්න හිතන් ඉන්න කෙනෙක්වත් ඔබතුමාගේ පුටුවේ හිටියා නම් ඕක කරන්නේ නැහැ. දැන් අගමැති වෙන්න එක්සත් ජාතික පක්ෂයේ පොරයක් තිබෙනවා නේ. [බාධා කිරීමක්] නැත්නම් ප්‍රශ්නයක් නැහැ. අපට කමක් නැහැ, කවුරු කර ගත්තත්. ඔබතුමා එහෙම කළේ ඇයි? මේ රටේ අම්මලා, මේ රටේ ජනතාව, මොකටද මේ මහන්සි වෙන්නේ? මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත් එක්ක කෑම මේසයේ සාකච්ඡාවක් කරලා මේ ප්‍රශ්නය ගොඩින් බේරා ගන්නද? නැහැ. මේක සහමුලින්- එතුමා නීත්‍යානුකූල ජනාධිපති. ඒක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපි කියන්නේ, මේ වැරැද්දට එතුමා ගෙවන්න ඕනෑ කියලායි. මේ වැරැද්ද එතුමා පිළිගන්න ඕනෑ. එතුමා ජාතියෙන් සමාව ගන්න ඕනෑ. රටට කරපු හානියට අනිවාර්යයෙන්ම මුදලින් ගෙවන්න ඕනෑ, මෛත්‍රීපාල සිරිසේනගේ සිට රාජපක්ෂ ඇතුළු සියලු දෙනාම. අන්න ඒ කටයුත්ත අපි අවධාරණය කරමින්, මේ යෝජනාව නැවත වතාවක් ස්ථිර කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු බිමල් රත්නායක මැතිතුමනි.

මීළඟට, ගෞරවනීය අතුරලියේ රතන නාහිමිපාණන් වහන්සේ.

[පූ.භා. 11.55]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේත් රටේත් විශාල ව්‍යාකූලත්වයක් තිබෙන මොහොතක සුළු වෙලාවක් හෝ මට කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම මම ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. දෙවනුව, මේ වර්තමාන පාර්ලිමේන්තුව ගොඩ නැඟීමේදී එවකට පැවැති රජය පරාජය කොට අලුත් රජයක් ස්ථාපිත කිරීම සඳහා මා දරපු ප්‍රයත්නය පිළිබඳව සියලු දෙනා තුළම ගරුත්වයක් ඇතැයි කියා මා විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි. ඒ වෙලාවේ, මේ අද කථා කරන සමහරු කථා නොකරන තත්ත්වයක් තුළ එදා විශාල අභියෝගයක් භාර අරගෙන එක්සත් ජාතික පක්ෂය සමඟ අප සියලුදෙනාම එකතු වෙලා අලුත් ජනාධිපතිවරයෙක් පත් කර ගැනීම සඳහා විශාල කැප කිරීමක් කළා. මා හිතන විධියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා වීමට ප්‍රථම අමාත්‍යවරයෙක් හැටියට එතුමාටත් හඬක් තිබුණා. ඒ වාගේම අපට තිබුණු සමාජ මතය, පිළිගැනීම, පක්ෂයක් විධියට; ජාතික හෙළ උරුමය විධියට, භික්ෂූන්වහන්සේ නමක් හැටියට ඒ සියල්ලම පරිත්‍යාග කරලා තමයි මේ වර්තමාන ජනාධිපතිවරයා බලයට පත් කර ගැනීම සඳහා අපි පියවර ගත්තේ.

පසුගිය ආණ්ඩුව කාලයේ මුළු කොළඹ නගරයම කැසිනෝ කලාපයක් බවට පත් කරන්න ගැසට් පත්‍රයක් නිකුත් කළා. ඒ වෙලාවේ, ඒකට විරුද්ධව එදා ආණ්ඩුවේ ඉඳගෙන නිර්භීතව ඡන්දය දුන්නේ මම පමණයි. මම ඒකට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා; ඒකට විරුද්ධව කථා කළා. ඒ වාගේම ගිය ආණ්ඩුව කාලයේ තිබුණු යම් යම් ව්‍යාපෘති ගැනත්, ජාවාරම්කාර සමාගම්වලට ඉඩම් දීමට විරුද්ධවත් ආණ්ඩුව තුළ ඉඳගෙන මගේ ස්ථාවරය ඉතාම නිර්භයව මම ප්‍රකාශ කළා, ගරු කථානායකතුමනි. මගේ හෘදය සාක්ෂියට අනුව රට වෙනුවෙන් අදත් මගේ අදහස මම ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මේ ඇතිවෙලා තිබෙන ව්‍යාකූලත්වය ඉදිරියේ ජනාධිපතිතුමාට බැණ වැදීමෙන් හෝ වෙනත් විධියකින් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්කමක් නැහැ. ව්‍යවස්ථාදායකය, අධිකරණය හා විධායකය අතර සමමිතිකත්වයක් නැති තැන, විසංවාදයක් ඇති වූ තැන විශාල දේශපාලන වියවුලක් නිර්මාණය කරනවා. අපේ ව්‍යවස්ථාව ගෙන යන්න නම් විශේෂයෙන්ම ව්‍යවස්ථාදායකය හා අධිකරණය තුළ ඒකමතිකත්වයක් තිබිය යුතුයි.

ගරු කථානායකතුමනි, 2002දී පත් වුණු ආණ්ඩුව; 2004 දක්වා ගිය ආණ්ඩුව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් විසුරුවා හැරිය බව ඔබතුමා දන්නවා. එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70වන ව්‍යවස්ථාව පාවිච්චි කරලා, "ජනතා පරමාධිපත්‍යය" නමින් ජනාධිපතිවරයා සතුව තිබුණු බලතල පාවිච්චි කරලා තමයි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඒ තීන්දුව ගත්තේ. ඒ තීන්දුව ගැනීමට ප්‍රථම, හිටපු අග්‍රාමාත්‍යතුමා අධිකරණයට විශේෂ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. එය තමයි, විධායක ජනාධිපතිවරයාට තිබෙන පාර්ලිමේන්තුව විසුරුවීමේ බලය අහෝසි කරන්න ඕනෑය කියන පනත් කෙටුම්පත. එදා ජයම්පති වික්‍රමරත්න මැතිතුමා ජනාධිපති නීතිඥවරයකු හැටියට ඒ ගැසට් පත්‍රිකාවට විරුද්ධව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය වෙනුවෙන් පෙනී සිටියා. ජනතා පරමාධිපත්‍යය සතු බලය, එනම් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අයින් කරන්න නම් ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා එදා ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් තීන්දුවක් ලබා දුන්නා. 1978 ව්‍යවස්ථාවේ යම් යම් පරස්පරතා, විසංවාදයන් තිබෙනවා. විශේෂයෙන්ම එහි තිබෙන බරපතළම අවුල; ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර ඇති වන අවුල තමයි, මේ ඡන්ද ක්‍රමය පිළිබඳ ගැටලුව. ප්‍රේමදාස මහත්මයා බලයට එන්න කලින් තිබුණේ, සියයට 12ක් ගත්ත අයට අනුපාත ක්‍රමයට පාර්ලිමේන්තු නියෝජනයක් ලැබෙන විධියටයි. පසුව ඒක වෙනස් වුණා. දැන් පවතින මේ ඡන්ද ක්‍රමය යටතේ ප්‍රසිද්ධ මිනිසුන්, ඇමතිකම් දරපු මිනිසුන් කවදාවත් පාර්ලිමේන්තුවෙන් අයින් කරන්න බැහැ. පරාජය වන මිනිසුන් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට එනවා. ඒ නිසා, අපි සියලුදෙනාගේම සම්මුතියෙන් සම්මත කළ හැකි එක දෙයක් හැටියට අපි දැක්කේ මේ ඡන්ද ක්‍රමය වෙනස් කර ගැනීමේ අවශ්‍යතාවයි. අද මේ ව්‍යාකූලත්වයට හේතුවත් මේ ඡන්ද ක්‍රමය පිළිබඳව තිබෙන ප්‍රශ්නයයි.

2004දී අපි පාර්ලිමේන්තුවට එනකොට මේ රට ත්‍රස්තවාදයෙන් වෙළී ගිය රටක්. අපි පාර්ලිමේන්තු ආසන නවයක් ලබා ගත්තා, ගරු කථානායකතුමනි. ඒ වෙලාවේදී ආණ්ඩුවට

බහුතර බලයක් ලබා ගන්න බැරි වුණා. එදා අපි දිවුරුම් දෙනකොට අද පාර්ලිමේන්තුවේ ඇති වනවා වාගේම විශාල කාල ගෝට්ටියක් ඇති වුණා. අපේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න ඇති වුණා; ගුටි කන්න සිදු වුණා. එදාත් ඒ ආණ්ඩුවට බහුතර බලයක් තිබුණේ නැහැ. එදා අපි අවුරුද්දකට වැඩි කාලයක් විපක්ෂයේ ඉඳගෙන, පාර්ලිමේන්තු කණ්ඩායමේ නවදෙනාගේ කණ්ඩායම් නායකයා හැටියට පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, ත්‍රස්තවාදය පරාජය කිරීමට විශාල බලයක් හැදුවා. විශාල බලයක් හදලා, ඒ ආණ්ඩුවට සම්පූර්ණයෙන්ම අපේ සහාය ලබා දුන්නා. අපි අලුත් ව්‍යාපාරයක් විධියට ඇවිල්ලා ත්‍රස්තවාදය පරාජය කිරීමට කටයුතු කළා. එදා එහෙම මතවාදයක් තිබුණේ නැහැ. "සාකච්ඡාවෙන් විතරක් මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්" කියා එදා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය කිව්වා. ඔය ජාතිය ගැන කථා කරන අය ෆෙඩරල් යෝජනාවක් ගෙනැල්ලා, 1999දී ෆෙඩරල් ව්‍යවස්ථාවක් අත්සන් කළා. ඒ සියල්ලම වෙනස් කරලා, රටේ ඒකීයභාවය තහවුරු කරලා, අපි ත්‍රස්තවාදය පරාජය කළා. එදා අපි ලබා ගත්ත ආසන නවය ඓතිහාසික ආසන නවයක් බවට පත් වුණා. ඒක කෙළවර වුණේ මුළු ශ්‍රී ලංකාවම පෙළන ලද ත්‍රස්තවාදය අවසන් වීමෙන්.

ගරු කථානායකතුමනි, මේ ව්‍යාකුලත්වය මත දැන් ප්‍රශ්න ගණනාවක් මතුවෙලා තිබෙනවා. මේ ආණ්ඩුව පිළිබඳව මගේ හෘදය සාක්ෂිය කියන දෙය, මගේ ව්‍යාකුලත්වය කිව යුතුයි කියා මා කල්පනා කරනවා. අපි සිංගප්පූරුව සමඟ ගිවිසුමක් අත්සන් කළා. එම සිංගප්පූරු ගිවිසුම අත්සන් කරද්දි විනිවිදභාවයකින් යුක්තව, වෙළඳ සංගම් එක්ක කථා කළ යුතුව තිබුණා. දේශීය නිෂ්පාදකයන්ගේ සංගම් සියල්ලම වාගේ මේ සිංගප්පූරු වෙළෙඳ ගිවිසුමට විරුද්ධ වුණා. සියලුදෙනාම මධ්‍යස්ථයි කියලා කිව්වා. මමත්, අගමැතිතුමා මුණ ගැහිලා කිව්වා, "අපි මුලින්ම ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කරමු" කියලා. ගරු කථානායකතුමනි, ඒක අන්තර්ජාතිකව පිළිගත් තත්ත්වයක්. ඕනෑම රටක් වෙළෙඳ ගිවිසුම් අත්සන් කරන්න කලින්, රටේ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කළ යුතුයි.

අපි විධිමත් සාකච්ඡාවකින් එවැනි වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කළේ නැහැ. සිංගප්පූරුවේ කුණු ටික පවා, ඒ කියන්නේ ඉස්පිරිතාලවල අපද්‍රව්‍ය, වෙනත් විවිධ අපද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය පවා ගෙනැල්ලා ලංකාවේ ප්‍රතිචක්‍රීකරණය කරන වැඩසටහනක් සඳහා තීන්දු ගත්තා. චීනය මේ තීන්දුව ගත්තාට පසුව, 1996දී චීනයේ,- [බාධා කිරීමක්]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අසත්‍ය දේවල් කියන්න එපා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මගේ කථාවට ඇහුම් කන් දීලා ඔබතුමා උත්තර දෙන්න කෝ. ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථා කරන්න අවස්ථාව දෙන්න. Do not disturb.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
චීනයේත් මේ වාගේම තීරණයක් ගත්තා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඒ තීරණය ගත්තාට පසුව චීනයේ මොකක්ද වුණේ? ඔවුන් විශාල අද්දැකීමක් ලබාගෙන, ඒ තීන්දුවට විරුද්ධව, විදේශීය රටවල කුණු බැහැර කිරීම සම්පූර්ණයෙන්ම නතර කිරීමේ ප්‍රතිපත්තියකට ආවා. ගරු කථානායකතුමනි, ලෝකයේ quarantine law කියා එකක් තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? ජීවමය දේවල් තැනින් තැනට ගෙන යෑමේදී ඇති වන ප්‍රශ්න ගැන ලෝකයේ පරිසර විද්‍යාඥයන් අතර ඉතාම බරපතළ විධියේ නීති සම්මත වන තත්ත්වයකුයි අද පවතින්නේ. ඒවා සම්බන්ධයෙන් අපේ පාරිසරික නීතිය අපි තවම හරියට ශක්තිමත් කර නැහැ. මේ වනවිටත් ඒ පරිසර නීතියෙන් බැහැරව ගිහින් විවිධ පළාත්වල විවිධ දේවල් සිද්ධ වනවා. ඒ නිසා අපි අපේ රටේ පරිසර නීතිය අලුත් ලෝකයේ අලුත් පරිසර නීතින් එක්ක සම්මත කළ යුතුව තිබුණා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව, රජයේ ඉඩම් පිළිබඳව ප්‍රතිපත්තියක් තිබුණේත් නැහැ. අද වතු කම්කරුවන්ගේ තත්ත්වය ඉතාම බරපතළ තැනකයි තිබෙන්නේ. [බාධා කිරීම්] ඔවුන් අදත් ඉන්නේ වහල් සේවයේයි. [බාධා කිරීම්] එය වෙනස් කළ යුතුය කියා අපි කල්පනා කරනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අද මධ්‍යම කඳුකරයේ ඇට තේ -ඒ කියන්නේ, බ්‍රිතාන්‍ය යුගයේ තේ- වගා කළ අක්කර එක්ලක්ෂ විසිදාහක් තිබෙනවා. ඒ තේ ඉඩම් සඳහා වැඩ පිළිවෙළක් හදන්න, ඒ ඉඩම් විකුණන්න එපාය කියා මම රජයට ප්‍රතිපත්තියක් ඉදිරිපත් කළා. ඒකත් ජයග්‍රහණය කරවන්න බැරි වුණා. ගරු බිමල් රත්නායක මැතිතුමා කියපු එක අදහසක් මම පිළිගන්නවා. ඒ තමයි, විධායක ජනාධිපතිතුමා විධායක ජනාධිපතිවරයා හැටියට ඔහුගේ බලය පාවිච්චි කළේ නැහැය කියන එක. මගේ විවේචනයක් හැටියට ජනාධිපතිතුමාට මම පෞද්ගලිකවත් ඒ විවේචනය කර තිබෙනවා. මේ සභාවේදීත් මට එය කරන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, හම්බන්තොට වරාය පිළිබඳව අපිත් කථා කළා; විවිධ කණ්ඩායම් කථා කළා. ඒ අයට සියයට 85ක් සහ අපට සියයට 15ක අයිතිවාසිකමක් ලෙස දුන් අපේ රටේ හම්බන්තොට වරාය 99 අවුරුද්දකට අපට අහිමි වුණා. හම්බන්තොට ඉඩම් දීම පිළිබඳ ප්‍රතිපත්ති විශාල විවාදයකට තුඩු දුන්නා. ගරු කථානායකතුමනි, ඒ නිසා අපට අවශ්‍ය කළේ මේ තත්ත්වය වහාම නතර කර ගැනීමටයි.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය යටතේ මම යෝජනාවක් කරන්න කැමැතියි. මෙහිදී යම් කටයුත්තක් කරන්න අප සියලුදෙනා එකතු විය යුතුයි කියා මම හිතනවා; මා එසේ කල්පනා කරනවා. කුමකටද ඒ එකතුව? අගමැතිකමේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉන්නවාද, එහෙම නැතිනම් වෙනත් කෙනකු ඉන්නවාද කියන එක නොවෙයි ප්‍රශ්නය. පළමුවෙන්ම, අප කෙටි කාලයකට, කළ යුතු දේ සහ නොකළ යුතු දේ පිළිබඳව ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතුයි. දෙපාර්ශ්වයේම එකඟතාවෙන් මාස තුනත් හයත් අතර කාලයකට අප සම්මුතියකට එන්න ඕනෑය කියා මම හිතනවා. [බාධා කිරීම්] ආණ්ඩු බලය තියාගෙන එක පාර්ශ්වයක් ඡන්දයට යනවා වෙනුවට දෙපාර්ශ්වයටම බලය ලැබෙන විධියට ප්‍රතිපත්තියක් සම්මත කළ යුතුය කියා මම කල්පනා කරනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, ඒ අනුව මම විශ්වාස කරනවා, පාර්ලිමේන්තුවේ බහුතර බලය තිබෙන- [බාධා කිරීම්] එක්සත්

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

ජාතික පක්ෂයේ හෝ වෙනත් පක්ෂයක හෝ යම් පුද්ගලයකුට පාර්ලිමේන්තුවේ බහුතර බලයක් තිබෙනවා නම් ජනාධිපතිවරයාට එය දරාගෙන ඉන්න බැහැය කියන එක මා පිළිගන්නවා. එය කලිනුත් ඉදිරිපත් කළා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අප පෙනී ඉන්නවා නම්, යම්කිසි පාර්ශ්වයකට පාර්ලිමේන්තුවේ විශ්වාසය නැතිව ඒ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න බැහැ කියා මා කල්පනා කරනවා. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
අග්‍රාමාත්‍යතුමා දන්නවා,- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

අග්‍රාමාත්‍යතුමා දන්නවා,- [බාධා කිරීම්] ඔබතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ආ මොහොතේදී මා ඔබතුමා සමඟ සාකච්ඡා කළා. [බාධා කිරීම්] මොකක්ද මම ඔබතුමා සමඟ සාකච්ඡා කළේ? [බාධා කිරීම්] විශ්වාස භංගය පරදීද, නැද්ද කියා හැම පාර්ශ්වයම සලිතභාවයෙන් සිටියා. ඒ අවස්ථාවේදී අප කිව්වේ මාස 6ක් ඇතුළත දෙපාර්ශ්වයෙන්ම එකඟ වන සම්මුතියකට ඇවිල්ලා මැතිවරණයකට යමු කියායි. [බාධා කිරීම්] අද අපි දකින ප්‍රධානම දේ තමයි, මේ වියවුලෙන්- [බාධා කිරීම්] පසුගිය කාලයේ පළාත් පාලන මැතිවරණයක් පවත්වා තිබෙනවා. අද පළාත් සභා මැතිවරණ කල් දමා තිබෙනවා. අපි පළාත් සභා මැතිවරණ කල් දැම්මේ ඡන්ද ක්‍රමය වෙනස් කරන්නයි. ඡන්ද ක්‍රමය වෙනස් කළාද නැද්ද, සීමා නිර්ණය කළාද නැද්ද කියන ප්‍රශ්නය අද තිබෙනවා. අප කවුරුත් එකඟතාවෙන් මෙන්න මේ සම්මුතිවලට ඇවිල්ලා, ඉතාම ඉක්මනින් මැතිවරණයකට ගිහින්, ඉදිරි මැතිවරණයකදී ජනතාවගේ ජන මතය උරගා බැලිය යුතුය කියා මා කල්පනා කරනවා. ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු හිමිපාණන් වහන්ස. Next, the Hon. (Dr.) Rajitha Senaratne, please.

[අ.භා. 12.07]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, ඇත්තටම මම අද සභා වාරයට ආවේ කථාවක් කරන්න නොවෙයි. මේ යෝජනාව නීතියට එරෙහි අග්‍රාමාත්‍යවරයෙකුගේ වැය ශීර්ෂය කපා හැරීමට සහයෝගය දීම සඳහා පමණයි. නමුත් අපේ ජනාධිපති නීතිඥ ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ කථාවට පස්සේ මට හිතුණා, යම් අදහසක් ප්‍රකාශ කරන්න. අපි මේ රටේ විශාලම අරගළකාරී මොහොතක අද ඉන්නේ. අද මේ රටේ රාජ්‍ය තන්ත්‍රය කොහේවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. විශාලම අරගළය ඒක. එතකොට අරගළයක් තිබෙන මොහොතක අපේ නෙත් ඒ අරගළයේ ඉදිරියෙන්. අරගළය කොහේද? ඒක සාධාරණත්වය සඳහා අරගළය. අපි ඒ අරගළය සඳහා කැපවීමෙන් ක්‍රියා කරනවා, ගරු කථානායකතුමනි. ඒ අනුව, පාර්ලිමේන්තුවේ අයිතිය ආරක්ෂා කර ගැනීම සඳහා, මේ ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය ආරක්ෂා කර ගැනීම සඳහා හැමදාම සටන් කළා වාගේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අපි සටන් කළා. මේ හැම අරගළයක් තුළම සාමය ගොඩනගා ගත හැකියි. අපි ඉගෙන ගෙන තිබෙනවා, පරණ වමේ පොත්වල අරගළය තුළ සාමය ගොඩනඟන්නේ කොහොමද කියලා. ඒක ඉතාම අමාරු දෙය. ඒක ඉතාම ජනප්‍රිය දේකුත් නොවෙයි. ඒක ඉතාම කයෝර දෙයක්. එය අරගළය තුළින් ගොඩ නගා ගන්නේ කොහොමද? එතුමා ඉදිරිපත් කරපු අදහස, "පුද්ගලයෝ කවුද කියන කාරණය මට වැඩක් නැහැ. මේ වෙලාවේ අපි හිතන්නට ඕනෑ, කවුද හරි, කවුද වැරදි කියන එක නොව කුමක්ද හරි, කුමක්ද වැරදි." කියන එකයි. අපි "කුමක්ද, හරි" කියන ස්ථාවරයේ තමයි දිගටම හිටියේ. අද අපේ අරගළය ජයග්‍රහණයෙන් ජයග්‍රහණයට ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. තව ඉදිරි කාලයේ කොච්චර දවසක් හිටියත් ඒක ජයග්‍රහණයේ දවස් ගණනාවක් මිසක් වෙන දවස් ගණනාවක් නොවෙයි. ඒක අපේ හතුරා පරාජයෙන් පරාජයට යන හැම දවසක්ම බවට පත්වෙනවා. ඒකත් ජන කථාවක් නොවෙයි. නමුත් අපි දිනනවා. ඒ ගොල්ලෝ පරදිනවා. ඒ වාගේම රට පරදිනවා. රටේ ජනතාව පරදිනවා. තව ටික දවසක් යනකොට පිළිකා රෝගීන්ට පිළිකා ඖෂධ ටික නැති වෙනවා. පිළිකා ඖෂධ නැතිවෙලා ඒ මිනිහා මියගියාට පස්සේ අපි දිනුවත් ජීවිතය ආපසු ගන්න බැහැ. හෘද රෝගියාට stent එකක් දෙන්න සල්ලි නැතිවෙලා ඒ මනුෂ්‍යයා මැරුණාට පස්සේ අපි දිනුවයි කියලා ඒ මනුෂ්‍යයාගේ පවුලට ඒකෙන් ඇති වැඩක් නැහැ. ඒ නිසා අද මේ සම්පූර්ණ අරගළය තුළ යමෙක් සාමයට සුදු ධජයක් ඔසවන්නේ නම්, මා ඒ සුදු ධජය කෙරෙහි ඉතාම උනන්දුවෙන් ඒ දෙස බලාගෙන ඉන්නවා. ඒක කවුරු නො ඔසවන්නේද කියන එක මට ප්‍රශ්නයක් නොවෙයි.

තමුන්නාන්සේලා දන්නවා, මේ ලෝකයේ යුග පෙරළියක් ඇති කරපු ඓතිහාසික දකුණු අප්‍රිකානු අරගළය ගැන. දකුණු අප්‍රිකානු අරගළයට ශ්‍රේෂ්ඨ නායකත්වය දුන් නෙල්සන් මැන්ඩෙලා ඒ වෙනුවෙන් අවුරුදු 27ක් සිරබත් කෑවා. ඊට නොදෙවෙනි නායකයා ඊබ්‍රාහිම්. එතුමා අවුරුදු 27ක් සිරබත් කෑවා, ගරිල්ලා භටයන් විධියට සටන් කරමින්. ඒ අරගළය අවසන් වුණේ කෙසේද? ඒ විප්ලවීය අරගළය අවසන් වුණේ ජයග්‍රහණය තුළින්ද? නැහැ. එක්තරා අවස්ථාවක ඩික් ක්ලාක් කියන මධ්‍යස්ථ මතවාදී සුදු පාලකයා ආවා. අවසානයේදී ඔහු කල්පනා කළා, "මේක දිනන්න බැරි වැඩක්. මම කොහොමද මේක අවසන් කරන්නට ඕනෑ." කියා. එළියේ ඉන්න අප්‍රිකානු ජාතික කොංග්‍රසයේ කළු ජාතිකවාදීන් එක්ක කථා කරන්නට ගියොත් ඒක ප්‍රශ්නයක් වන නිසා ඔහු කල්පනා කරලා පළවෙනි තීන්දුව ගත්තා, හිරේ ඉන්න නායකයෙක් එක්ක කථා කරන්න. ඔහු හොඳට අධ්‍යයනය කරලා කරලා, තීන්දු කර ගත්තා, "හිරේ ඉන්න කට්ටියගෙන් මම කථා කළ යුත්තේ නෙල්සන් මැන්ඩෙලා එක්ක." කියලා. මහ රාත්‍රී 11.30ට එතුමාගේ සියලුම කාර්යාල වහපු වෙලාවේ ඉතාම රහසිගත විධියට නෙල්සන් මැන්ඩෙලාව අග්‍රාමාත්‍ය කාර්යාලයට එතුමා ගෙන්නා ගත්තා. ඒ වාගේ රාත්‍රීන් ගණනාවක් ගියා, තර්ක විතර්ක තුළ. සුද්දන්ට මේක විකුණන්නේ කොහොමද, කල්ලන්ට මේක විකුණන්නේ කොහොමද කියා තමයි මේ දෙදෙනා කථා කළේ. ඒක තමයි අර අරගළයටත් වඩා අමාරු දෙය වුණේ.

අරගළය ගැන කථා කරලා, සාකච්ඡා මේසයට ගිහිල්ලා අවසානයේදී ආපහු කඩාගෙන වැටුණා, ආපහු යුද්ධය ඇවිළුණා, දුම්රිය පිටින්ම ගිනි තිබ්බා. මේ ඔක්කොමත් කරලා, එදා ඒ සාකච්ඡා මේසය අවසාන කරලා නෙල්සන් මැන්ඩෙලා කිව්වා, "වහාම නැවත ගරිල්ලා ව්‍යාපාරය ආරම්භ කරන්න." කියලා. නමුත්, ඒ සුදු ජාතිකවාදීන්ගේ සාම සාකච්ඡාවට සහභාගි වුණු ප්‍රධානියා රොල්ෆ් මේයර්- පසු කලෙක එතුමා විදේශ අමාත්‍යවරයා වුණා. වරෙක එතුමා ලංකාවට ආවාම මම අග්‍රාමාත්‍යතුමා සමඟ එතුමාව හමු වුණා- සහ ඒ සාකච්ඡාවට නායකයා වුණු රාමපෝසා කියන කළු ජාතික නායකයා කියන ඒ දෙදෙනාගේ පවුල් අතර මේ සාකච්ඡා මේසයේදී මිත්‍රත්වයක් ඇතිවෙලා තිබුණා. එදා රාත්‍රී 10.00ට රොල්ෆ් මේයර්ගෙන් දුරකථන පණිවුඩයක් ආවා රාමපෝසාට. රාමපෝසා ඇහුවා, අපි ආයේ හම්බ වෙන්නේ කොයි වෙලාවේද කියලා. ඔවුන් දෙදෙනා හමු වුණා, ඔවුන් දෙදෙනා මේ සාකච්ඡාව දිගටම ගෙනිච්චා. ඒ අතරේ කල්ලන් සහ සුද්දන් යුද වැදිලා, යුද්ධය ඉදිරියට යනවා. ඒ සාකච්ඡාවේ අවසාන ප්‍රතිඵලය තමයි දකුණු අප්‍රිකානු අරගළය නිමාවෙලා මුළු රටටම විමුක්තිය ලැබීම.

ගරු කථානායකතුමනි, එම නිසා අපි මේ අරගළයට සහභාගි වෙනවා, අරගළයේ ඉදිරියෙන්ම ඉන්නවා. ඒ අතරේ යම් සාමයක් ඇති වෙනවා නම් ඒ සාමය සඳහා අපි ඉදිරියෙන්ම ඉන්නවා. මම ගරු විජයදාස රාජපක්ෂ මහත්මයාගේ කථාව ඉතාමත් වුවමනාවෙන් අහගෙන හිටියා. එතුමා අවසානයේ ඉදිරිපත් කරන විසඳුම මොකක්ද? සාම සාකච්ඡාවක් පමණක් නොව එතුමාගේ කථාවේ අවසාන කොටස තමයි මම ඉතාමත් වැදගත් ලෙස සලකන්නේ. ඒ මොකක්ද? එතුමා කියනවා, මේ පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන පුද්ගලයාට අග්‍රාමාත්‍ය ධුරය දීලා, ඒ පුද්ගලයා පත් කරන කැබිනට් මණ්ඩලයට කැබිනට් එක ලබා දීලා මේ ප්‍රශ්න විසඳීම සඳහා ගරු කථානායකතුමාට මැදිහත් වන්නට කියා. එතකොට කවුද මේකට විරුද්ධ? මේක තමයි අපේ අරගළය. මේකට තමයි අපි දිගටම ලංකාව පුරා සටන් වදින්නේ. මේක තමයි මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ. මේක තමයි බහුතර මතය. මේක තමයි ජාත්‍යන්තර මතය. මේක තමයි ලෝක මතය. කවුරුන් හෝ ඒක යෝජනා කරනවා නම්, ඒකට මැදිහත් වෙනවා නම් ඇයි අපි ඒකට විරුද්ධ වෙන්නේ? ඔහු මේ සභාවට තනියම ඇවිල්ලා - තනිපංගලමේ - අනෙක් සියලුදෙනාම පාර්ලිමේන්තුව වර්ජනය කරන විට ඒ තීන්දු, තීරණවලට විරුද්ධව මිනිහෙක් තනියම ඇවිල්ලා- කියනවා නම්, "මම ලැහැස්තියි මේකට අතපොවලා ඔබලාගේ සාධාරණ අයිතිය ආරක්ෂා කරන්න." කියලා, මම කියනවා, "මම එකඟයි ඒ අදහසට." කියා.

ගරු කථානායකතුමනි, එම නිසා මේ යෝජනාව මේ පැත්තෙන් සම්මත වෙනවා. ඒ වාගේම, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඔබතුමා පාර්ලිමේන්තුවට උත්තරීතර සේවයක් කළා. බ්‍රිතාන්‍යයේ කථානායකවරු හතර දෙනෙකු එදා තමන්ගේ ගෙල සිඳ ගත්තා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, විධායකයට එරෙහිව. හතර දෙනෙකු ජීවිත පූජා කළා. ඔබතුමා මේ ගරු සභාවට ආවේ ජීවිතය පූජා කරන්නට තමයි, ඉතා සුළු දෙයකින් තමයි ඒක එහාට මෙහාට වුණේ. මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කෙරෙන්නේ නම් එහිදී අනිවාර්යයෙන්ම රත්තරන් අකුරින් ඔබතුමාගේ නම ලියැවෙනවා, මේ රටේ එක යුගයක පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගලවා දුන් ඉෂ්ට දේවතාවා කියා. ඒක අපට අමතක කරන්නට බැහැ. ඉතිහාසය ලියැවෙන විට ඉතාමත් අවංකවයි ලියැවෙන්නේ. අපි කවුරුවත් ආස කරන විධියට නොවෙයි ඉතිහාසය ලියැවෙන්නේ. එම නිසා ඔබතුමා අද මේ පාර්ලිමේන්තුව ආරක්ෂා කළා. ඔබතුමාට ඒ ආත්ම ශක්තිය, කශේරුකාව තිබෙනවා. ඔබතුමා සාමකාමී බව ප්‍රදර්ශනය කළා.

මගේ මිත්‍ර ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඒ පැත්තේ ඉඳලා ඉදිරිපත් කළ දේ, -එතුමායි, මමයි හුඟාක් වෙලාවට මතවාදීව හිටියේ කඳවුරු දෙකක. නමුත්, ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ, කවුද මේවා යෝජනා කරන්නේ කියලා. -ඒ කාර්ය භාරය හරි නම් ගරු කථානායකතුමනි, එතුමා ඉල්ලන ඒ ඉල්ලීම ගැන ඔබතුමා වහාම ජනාධිපතිවරයා සමඟ කථා කරන්න. ජනාධිපතිවරයා ලැහැස්ති නම් ඒක සාමයෙන් විසඳා ගැනීමට, අපි ලැහැස්තියි. හැබැයි, ජනාධිපතිවරයා ලැහැස්ති නැත්නම් අවසානය වනතුරු, මේ අරගළය ජයග්‍රහණයෙන් කෙළවර වනතුරු මේ අග්‍රාමාත්‍යවරයා සමඟ සිටින්නට අපි සියලු දෙනාටම ආත්ම ශක්තියක් තිබෙන බව ප්‍රකාශ කරමින්, මම නිශ්ශබ්ද වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Motion is now before the House. Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

So, we will go for Electronic Voting. Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye!

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the division bells -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! දැන් ඡන්දය ලබා දීමේ අවස්ථාව; this is voting time. කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ස්ථානවල වාඩිවෙන්න. ඡන්දය ලබා දීමට අපහසුතාවක් තිබෙනවා නම් කරුණාකර අත ඔසවන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඡන්දය දීමට අපහසු ගරු මන්ත්‍රීවරු කරුණාකර අත් ඔසවන්න. [බාධා කිරීමක්] ඡන්දය දී අවසාන වන තෙක් ඉන්න.

කරුණාකර ඡන්දය ප්‍රකාශ කිරීමට බැරි වුණු ගරු මන්ත්‍රීතුමන්ලා නැඟිටින්න. Hon. Sampanthan, are you for or against?

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

I am supporting, Sir. ஆம்

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Fowzie?

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
I am supporting, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Kabir Hashim?

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Eran Wickramaratne?

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Sivamohan?

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
ஆம்

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. (Mrs.) Sriskandarasa?

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
ஆம்

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Srineshan?

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
ஆம்

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Is there anybody else?

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 116: විරුද්ධව 0 වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 116; எதிராக 0; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 116: Noes 0: Abstain 0.*

| | |
|---|---|
| O 001. Mangala Samaraweera | Yes |
| O 002. Gamini Jayawickrama Perera | Yes |
| O 003. John Amaratunga | Yes |
| O 004. Vijitha Herath | Yes |
| O 005. Anura Dissanayake | Yes |
| O 006. Dharmalingam Sithadthan | Yes |
| O 007. Mavai S. Senathirajah | Yes |
| O 009. Ranil Wickremesinghe | Yes |
| O 010. Lakshman Kiriella | Yes |
| O 011. Gayantha Karunatileka | Yes |
| O 013. Rauff Hakeem | Yes |
| O 014. Rajitha Senaratne | Yes |
| O 015. Piyasena Gamage | Yes |
| O 016. Rishad Bathiudeen | Yes |
| O 018. Sajith Premadasa | Yes |
| O 019. Mano Ganesan | Yes |
| O 021. Selvam Adaikkalanathan | Yes |
| O 022. Malik Samarawickrama | Yes |
| O 023. Nihal Galappaththi | Yes |
| O 024. Sunil Handunnetti | Yes |
| O 026. K. Thurairetnasingam | Yes |
| O 027. Seeniththamby Yoheswaran | Yes |
| O 028. S. Shritharan | Yes |
| O 029. Tilak Marapana | Yes |
| O 030. Wajira Abeywardana | Yes |
| O 031. Ravi Karunanayake | Yes |
| O 032. Field Marshal Sarath Fonseka | Yes |
| O 033. Patali Champika Ranawaka | Yes |
| O 034. Navin Dissanayake | Yes |
| O 035. P. Harrison | Yes |
| O 036. R.M. Ranjith Madduma Bandara | Yes |
| O 037. Arjuna Ranatunga | Yes |
| O 038. Palany Thigambaram | Yes |
| O 039. Chandrani Bandara | Yes |
| O 040. Thalatha Atukorale | Yes |
| O 041. Akila Viraj Kariyawasam | Yes |
| O 042. D.M. Swaminathan | Yes |
| O 043. Bimal Rathnayake | Yes |
| O 044. Nalinda Jayathissa | Yes |
| O 045. E. Saravanapavan | Yes |
| O 046. M.A. Sumanthiran | Yes |
| O 047. Kaveendiran Kodeeswaran | Yes |
| O 048. I. Charles Nirmalanathan | Yes |
| O 049. Abdul Haleem | Yes |
| O 050. Sagala Ratnayake | Yes |
| O 051. Harin Fernando | Yes |
| O 052. Daya Gamage | Yes |

| | |
|---|---|
| O 053. Ravindra Samaraweera | Yes |
| O 054. Vasantha Senanayake | Yes |
| O 055. Lucky Jayawardana | Yes |
| O 056. V.S. Radhakrishnan | Yes |
| O 057. Palitha Range Bandara | Yes |
| O 058. Dilip Wedaarachchi | Yes |
| O 059. Niroshan Perera | Yes |
| O 060. Ruwan Wijayawardene | Yes |
| O 061. A.D. Premadasa | Yes |
| O 062. Sujeewa Senasinghe | Yes |
| O 063. Wasantha Aluwihare | Yes |
| O 064. Vijayakala Maheswaran | Yes |
| O 069. Harsha De Silva | Yes |
| O 070. Ajith P. Perera | Yes |
| O 071. Ranjith Aluvihare | Yes |
| O 072. J.C. Alawathuwala | Yes |
| O 073. Vadivel Suresh | Yes |
| O 074. Ameer Ali Shihabdeen | Yes |
| O 075. Edward Gunasekara | Yes |
| O 076. Faizal Cassim | Yes |
| O 077. Anoma Gamage | Yes |
| O 078. Ranjan Ramanayake | Yes |
| O 079. Ashok Abeysinghe | Yes |
| O 080. H.M.M. Harees | Yes |
| O 081. Karunarathna Paranawithana | Yes |
| O 082. Palitha Kumara Thewarapperuma | Yes |
| O 083. Manusha Nanayakkara | Yes |
| O 084. Seyed Ali Zahir Moulana | Yes |
| O 085. Ajith Mannapperuma | Yes |
| O 086. Nalin Bandara Jayamaha | Yes |
| O 087. Buddhika Pathirana | Yes |
| O 088. M.S. Thowfeek | Yes |
| O 089. Abdullah Mahrooff | Yes |
| O 090. Sirinal de Mel | Yes |
| O 091. Anura Sidney Jayarathne | Yes |
| O 092. K.K. Piyadasa | Yes |
| O 093. Lakshman Ananda Wijemanne | Yes |
| O 094. A. A. Vijethunga | Yes |
| O 095. Hector Appuhamy | Yes |
| O 096. Sisira Kumara Abeysekara | Yes |
| O 097. Thushara Indunil Amarasena | Yes |
| O 098. A. Aravindh Kumar | Yes |
| O 099. Velu Kumar | Yes |
| O 100. Nalaka Prasad Colonne | Yes |
| O 101. Chandima Gamage | Yes |
| O 102. Kavinda Heshan Jayawardana | Yes |
| O 103. Mylvaganam Thilakarajah | Yes |
| O 104. Mayantha Dissanayake | Yes |
| O 105. Sujith Sanjaya Perera | Yes |
| O 106. Hirunika Premachandra | Yes |
| O 107. Bandula Lal Bandarigoda | Yes |
| O 108. M. Ibrahim Mohammad Mansoor | Yes |
| O 109. S.M. Marikkar | Yes |
| O 110. Imran Maharoof | Yes |
| O 111. Ashu Marasinghe | Yes |
| O 112. Ishak Rahuman | Yes |
| O 113. Mujibur Rahuman | Yes |
| O 114. Harshana Rajakaruna | Yes |
| O 115. Jayampathy Wickramaratne | Yes |
| O 116. Thusitha Wijemanna | Yes |
| G 021. Ananda Kumarasiri | Yes |
| G 109. Rohini Kumari Wijerathna | Yes |
| G 110. Chaminda Wijesiri | Yes |
| G 111. Hesha Withanage | Yes |
| G 112. Sandith Samarasinghe | Yes |
| G 113. Chathura Sandeepa Senaratne | Yes |
| G 114. Wijepala Hettiarachchi | Yes |
| G 115. Mohamadu Nazeer | Yes |
| G 116. S.M. Mohamed Ismail | Yes |

*Total Voting Results*

| | |
|---|---|
| Yes | 116 |
| No | 00 |
| Abstain | 00 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! අද දින න්‍යාය පත්‍රයේ සඳහන්, "ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව" නම් වූ යෝජනාව, විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 116ක්ද, නැඟී සිට පක්ෂව ඡන්ද 7ක්ද වශයෙන් ඡන්ද 123කින් සම්මත වූ බව සඳහන් කරන්න කැමැතියි. ඊට විරුද්ධව ඡන්ද කිසිවක් නැත. Abstained මන්ත්‍රීවරුන් නැත. ඒ අනුව යෝජනාව සම්මතයි.

අද දින සභාව එකඟ වූ පරිදි මෙම පාර්ලිමේන්තුව 2018 නොවැම්බර් මස 30වන සිකුරාදා පූ.භා.10.30 තෙක් කල් තබනු ලැබේ.

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 12.30 ට, 2018 නොවැම්බර් මස 30 වන සිකුරාදා පූ.භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பாராளுமன்றம், பி.ப. 12.30 மணிக்கு, 2018 நவம்பர் 30,வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 12.30 p.m., until 10.30 a.m. on Friday, 30th November, 2018.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.